**ජාතික ලොතරැයි මණ්ඩලය - 2019**
**--------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

ජාතික ලොතරැයි මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික ලොතරැයි මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
.............................................................

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම මෙම වාර්තාවේ මූල්‍යප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
.....................................................................................................................

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

..............................

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද හා ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුවේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම්, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**………………..**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

**………………………………………………………..**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතු භාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතු භාවය, පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවල දී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් සංගමය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුලත් කර ඇත.

**1.5.2 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූල නොවීම**

**……………………………………………………….**

| අදාළ ප්‍රමිතියට අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 13 හි ප්‍රමිතයේ 91 ඡේදයට අනුකූල වන පරිදි සාධාරණ අගය මැනීම පිළිබඳ මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. | 2020 වර්ෂයේදී හෙළිදරව් කිරීමට සටහන් කර ගෙන ඇත. | මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුව ගිණුම් පිළියෙල කළ යුතු වීම. |

**1.5.3 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

**…………………………………………………**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ප්‍රමිත අංක 01**

| | | | |
|---|---|---|---|
| (i) | ප්‍රමිතයේ 69 ඡේදයට අනුකූල නොවන ලෙස පෙර වර්ෂවලදී ජංගම වගකීම් ලෙස හඳුනා ගැනීම් කළ රු.51,734,747 ක් සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිවර්ත්‍ය කර වෙනත් ආදායමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර තිබුණු අතර | 2020 වර්ෂයේදී උපචිත වියදම් නිවැරදිව හඳුනා ගැනීමට අදාල අංශයන් දැනුවත් කර ඇත. | මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුව ගිණුම් පිළියෙල කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| මෙම ක්‍රමවේදය මණ්ඩලය විසින් පෙර වර්ෂවල සිටම දිගින් දිගටම අනුගමනය කරන බවත් නිරීක්ෂණය විය. | | |
| (ii) මණ්ඩලයේ නිලධාරීන් වෙත ලබා දී ඇති රු.39,177,041 ක ආපදා ණය මුදල ප්‍රමිතයේ 60 සහ 66 ඡේදවලට අනුකූල වන ලෙස නිරවුල් කරන කාලපරිච්ඡේදය අනුව ජංගම සහ ජංගම නොවන වත්කම් ලෙස වර්ග කර දක්වා නොතිබුණි. | 2020 වර්ෂයේදී ආපදා ණය මුදල, ජංගම සහ ජංගම නොවන වත්කම් ලෙස වර්ග කිරීමට සටහන් කර ගෙන ඇත. | එම |

**(ආ) ප්‍රමිත අංක 07**

| | | |
|---|---|---|
| (i) ත්‍යාග සංචිත ගිණුමට බැර කර තිබූ රු.233,574,416 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී බදු පෙර ලාභයට ගලපා තිබීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.. | ත්‍යාග සංචිතයේ මූල්‍ය විචල්‍ය වීමක් සිදු නොවෙතත් එහි විචල්‍යය දැක්වීම සිදු කළ යුතුය. එසේ නොමැති වුවහොත් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනයේ තුලනය වීමක් සිදු නොවන බව දැක්විය හැක. | එම |
| (ii) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධනයේ විචලනයන් ලෙස තොගවල වැඩි වීම රු.1, 099,590 ක් අඩුවෙන්ද වෙනත් ජංගම වත්කම් වල අඩු වීම එම වටිනාකමින් අඩුවෙන්ද දක්වා තිබුණි. | 2020 වර්ෂයේදී මෙවැනි විචලනයන් සිදු වුවහොත් තොගයන් වලින් ගැලපීම් කිරීමට සටහන් කර ගෙන ඇත. | එම |

**(ඇ) ප්‍රමිත අංක 08**

| | | |
|---|---|---|
| මණ්ඩලය විසින් පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශනවලට අදාළව ඉදිරිපත් කළ ගිණුම් ප්‍රතිපත්තිහි සටහන් අංක 2.1.8 අනුව ආදායම හා ඊට අදාළ පිරිවැය මූල්‍ය ප්‍රකාශන තුල වෙන වෙනම පෙන්විය යුතු වුවත් ඊට පටහැනි ලෙස මණ්ඩලය මිලදී ගෙන තිබූ ලොතරැයිපත්වලට හිමි ත්‍යාග වටිනාකම අදාළ පිරිවැයන්ගෙන් අඩුකර දක්වා තිබුණු බව නිරීක්ෂණය විය. | මෙවැනි ගනුදෙනු ඉදිරියේදී සිදු වුවහොත් ආදායම හා වියදම වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කිරීමට සටහන් කර ගෙන ඇත. | එම |

**(ඈ) ප්‍රමිත අංක 12**

| | | |
|---|---|---|
| මණ්ඩලය විසින් පෙර වර්ෂයන්ට අදාලව වැරදි නිවැරදි කිරීම් ලෙස රඳවාගත් ලාභයට ගැලපීම් කර තිබූ තොග අතහැරීම් වටිනාකම රු.1,099,590 ක්ද පෙර වර්ෂයේදී ගිණුම්ගත නොකළ ගෙවිය යුතු වියදම් රු.3,912,369 ක්ද හා පෙර වර්ෂයේ ඌන ක්ෂය වෙන් කිරීම රු.3,967 ක්ද වෙනුවෙන් ප්‍රතිපාදනය කළ ආදායම් බදු මුදල වන රු.788,696 ක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 හි 62A ඡේදයට අනුකූල නොවන ලෙස සමාලෝචිත වර්ෂයේ | පෙර වර්ෂයේ ආදායම් බදු ගණනට අදාළ නිවැරදි කිරීම් හා ඉදිරියේදී ප්‍රමිතියට අනුව ගැලපීමට සටහන් කර ගෙන ඇත. | එම |

බදු වියදමින් අඩුකර දක්වා තිබුණි. මෙම අතීතානුයෝගී ගැලපීම සම්බන්ධව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හා 08 අනුව අදාළ හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

**(ඉ) ප්‍රමිත අංක1 6**

| | | |
|---|---|---|
| මණ්ඩලය සතු රු.350,153,304 ක්වූ නිෂ්ක්‍රීය වත්කම්වල අගය සම්පූර්ණයෙන් ලියාහැර ඇති නමුත් තවදුරටත් භාවිතයට ගන්නා එම වත්කම්වල ධාරණ අගය ප්‍රමිතයේ 79 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කර නොතිබුණි. | 2020 වර්ෂයේදී ගිණුම් වල හෙළිදරව් කිරීමට සටහන් කර ගෙන ඇත. | එම |

**(ඊ) ප්‍රමිත අංක1 9**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලය විසින් සේවක පාරිතෝෂික ලෙස රු.61,842,602 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද එයට සුදුසු ආයෝජන සැලැස්මක් සකස් කර නොතිබුණි. එසේම ප්‍රමිතයේ 135 ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරී අලාභය හඳුනාගැනීම සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කරද නොතිබුණි. | මණ්ඩලය විසින් 2019.12.31 දිනට රු.53,000,000.00 ක්ද අතිරේකව මුදලක් 2020 වර්ෂයේදී එකී තැන්පතුවට එකතු කර ආයෝජනය කර ඇත. එමෙන්ම ආයු ගණන අලාභය හඳුනා ගැනීම සම්බන්ධව 2020 වර්ෂයේදී හෙළිදරව් කිරීමට සටහන් කර ගෙන ඇත. | එම |

**(උ) ප්‍රමිත අංක 24**

| | | |
|---|---|---|
| ප්‍රමිතයේ 17 ඡේදය සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 හි 25 වන ඡේදය ප්‍රකාරව පහත සඳහන් කළමනාකරණ හා සේවක ප්‍රතිලාභ වර්ගවල එකතුන් වෙන් වෙන් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.<br>• කෙටිකාලීන සේවක ප්‍රතිලාභ<br>• පශ්චාත් සේවා ප්‍රතිලාභ<br>• වෙනත් දිගුකාලීන ප්‍රතිලාභ<br>• සමාප්ති ප්‍රතිලාභ | 2020 වර්ෂයේදී හෙළිදරව් කිරීමට සටහන් කර ගෙන ඇත. | එම |

**(ඌ) ප්‍රමිතඅංක 36**

| | | |
|---|---|---|
| ප්‍රමිතයේ 12 වන ඡේදය ප්‍රකාරව වත්කම් හානිකරණ පිළිබඳව පරීක්ෂාවන් සිදු කිරීම කර නොතිබුණි. | 2020 වර්ෂයේදී වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදු කර ඉන් ලැබෙන වටිනාකම් මත වත්කම් හානිකරණය පිළිබඳ ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | එම |

**1.5.4 ගිණුම්කරණ අඩුපාඩු**

**........................**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදී පවත්වන ලද දිනුම් වාරයන් වෙනුවෙන් වූ ත්‍යාග සඳහා වෙන් කිරීම්වලින් ඉතිරිව පැවති රු.233,574,416 ක මුදල රඳවාගත් ලාභයට හර කර ත්‍යාග සංචිත අරමුදලට බැර කළ යුතු වුවත් එය වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ත්‍යාග සඳහා වෙන් කරන ලද නමුත් ඉතිරිව පැවති ත්‍යාග වටිනාකම මණ්ඩලය විසින් මාස 06කට පසු ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරයි. එම නිසා එකී ත්‍යාග වටිනාකම වියදමක් වන බැවින් ලාභය අඩුවෙන් දක්වා නොමැත. | නිවැරදි ගිණුම්කරණ ක්‍රම වේදය අනුගමනය කල යුතු වීම. |
| (ආ) මණ්ඩලය විසින් පෞද්ලික බැංකුවක ආයෝජනය කර තිබූ රු.5,336,575 ක මුදලක් 2008 අප්‍රේල් 23 දිනැති අංක 1546/18 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් රජයට පවරා ගෙන තිබුණද, ඒ සඳහා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් නොකර එම මුදල ආයෝජන යටතේ තවදුරටත් දක්වා තිබුණි. | 2002 ජුනි 12 වැනි දින ප්‍රමුඛ බැංකුව ඇවර කිරීම මත 2008.04.23 දිනැති ගැසට් පත්‍රය මගින් ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ ස්කන්ධ ප්‍රාග්ධනයට (Equity) මාරු කර ඇත.<br>රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙම මුදල ලියාහැරීමට අවශ්‍ය නිර්දේශය ලබාදෙන ලෙස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ලිපියකින් දන්වා ඇති අතර ඒ සඳහා තවම පිළිතුරු ලිපියක් ලැබී නොමැත. | අදාළ අනුමැතීන් අනුව ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කිරීම. |
| (ඇ) රු.3,983,844 ක් වූ මණ්ඩලයේ විලම්භිත බදු වත්කම් වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වූ වගකීම් වලින් අඩු කර දක්වා තිබුණි. | විලම්භිත බදු වත්කම, ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවල වත්කම් යටතේ ඉදිරිපත් කිරීමට සටහන් කර ගෙන ඇත. | ගිණුම්කරණ මූලධර්ම අනුව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) ප්‍රවර්ථන වර්ෂයේදී විලම්භිත බදු ගණනය කිරීමේදී 2015 වර්ෂයේදී අත්පත් කරගත් මොටර් රථ සහ ගෘහ භාණ්ඩවල බදු ලියාහැර ඇති අගය සමාලෝචිත වර්ෂය අවසානයේදී ශුන්‍ය විය යුතු වුවත් එම අගය සාවද්‍ය ලෙස රු.2,106,732 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂයේදී විලම්භිත බදු වෙන් කිරීම රු.589,884 කින් වැඩියෙන් දක්වා තිබුණි. | විලම්භිත බදු ප්‍රමාණය වරහන් තුළ දක්වා තිබුණද, ශේෂය නිවැරදිව ගණනය කර ප්‍රකාශ කර ඇත. | ගිණුම්කරණ හා බදු මූලධර්ම අනුව කටයුතු කිරීම. |
| (ඉ) 2017 වර්ෂයේදී ආදායම් බදු ගණනය කිරීමේදී අඩු කිරීම් යටතට නොගැනෙන රු.1,355,557 ක හානිකරණ අලාභයක් සහ මණ්ඩලය විසින්ම මණ්ඩලයේ | 2017 වර්ෂයේ වියදම්වලට අදාළව ආදායම් බදු ගණනය කර ගෙවීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ හා බදු මූලධර්ම අනුව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| ලොතරැයිපත් මිලදී ගැනීමට වැය කළ රු.16,325,700 ක සුදුසුකම් නොලබන වියදමක්ද අඩු කිරීම් ලෙස සලකා ආදායම් බදු වියදම ගණනය කර තිබුණි. එම වැරදි නිවැරදි කර ඒ වෙනුවෙන් ගෙවිය යුතු බදු මුදල විගණිත දින වන විටත් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඊ) සමාලෝචිත වර්ෂය තුළ ලොතරැයි බෙදාහැරීමේ නියෝජිතයන් විසින් මණ්ඩලය වෙත ඉදිරිපත් නොකළ ලොතරැයිපත් 176,313 ක් වෙනුවෙන් දඩ මුදල් ලෙස අයවිය යුතු රු.3,526,260 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි . | දිස්ත්‍රික් අලෙවි නියෝජිතයන් හට මාස 3 කට වරක් ගෙවනු ලබන ශත 0.05 ක කොමිස් මුදලින් එක් ලොතරැයිපතක් සඳහා රු.16.50 ක මුදලක් සහ ශත 0.05 ක දඩ මුදලක් ලෙස අය කර ගිණුම් ගත කරනු ලැබේ. | නියෝජිතයින් විසින් ආපසු එවනු ලබන ලොතරැයිපත් නොපමාව ගෙන්වා ගැනීමට කටයුතු කිරීම. |
| (උ) 2019 මැයි 13 හා 14 දිනයන්හි වයඹ පළාතේ පැවති ඇඳිරි නීතිය හේතුවෙන් නියෝජිතයින්ට අලෙවිකල ලොතරැයිපත් 307931 ක් මණ්ඩලය විසින්ම මිලදී ගෙන තිබුණි. තවද ලේඛන පැවැත්වීමේ දුර්වලතා මත ලොතරැයිපත් 7431 ක් වෙනුවෙන් වූ රු. 148,740 ක පිරිවැය ද අඩුවෙන් සටහන් වී තිබුණි. මණ්ඩලය විසින් මිලදීගත් ලොතරැයිපත් වෙනුවෙන් පසුව පැවැත්වූ දිනුම්වාරයක් සඳහා නියෝජිතයින්ට ලොතරැයිපත් නිකුත් කිරීමේදි ලොතරැයිපත් 13169 ක් වැඩිපුර නිකුත් කර තිබූ අතර රු.214,655 ක් වූ ඒවායේ පිරිවැය ගිණුම්ගත කර නොතිබුණි. මණ්ඩලය විසින් භාරගත් ලොතරැයිපත් 300494 ක පිරිවැය ණය ගැතියන්ගේ ගිණුමට බැර නොකර උපචිත වියදම් ගිණුමට බැරවීම නිසා වර්ෂයේ ණයගැතියෝ රු.4,898,052 කින් වැඩිපුර දක්වා තිබුණු අතර උපචිත වියදම් ද එම ප්‍රමාණයෙන් වැඩිපුර දක්වා තිබුණි. ඒ අනුව අඩමාන ණය වෙන්කිරීම් වටිනාකම ද රු.244,961 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මණ්ඩලය මිලදී ගත් මුළු ලොතරැයිපත් ප්‍රමාණය 307931 ක් වූ අතර නියෝජිතයින්ට ඒ සඳහා ලබාදුන් මුළු ලොතරැයිපත් ප්‍රමාණය 321100 කි. වැඩිපුර නියෝජිතවරුන්ට නිකුත් කර තිබූ ලොතරැයිපත් 13169 ට අදාල අය කර ගැනීම් සිදුකර ඇත. මෙවැනි ගණුදෙනු ඉදිරියේදී සිදු වුවහොත් ණයගැතියන්ට අදාළ ගැලපීම් සිදුකොට ගිණුම්ගත කිරීමට සටහන් කරගෙන ඇත. | නිවැරදිව ගිණුම් ගත කිරීම සිදු කිරීම. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**……………………………………**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලය විසින් ණය පදනම මත අලෙවි නියෝජිතයන්ට 2013 සිට 2018 දක්වා නිකුත් කර තිබූ ලොතරැයි අලෙවි කුට් වෙනුවෙන් අයවිය යුතු රු.4,739,226 ක් ද අලෙවි නියෝජිතයින් 91 කට ලබාදී තිබූ පාපැදි වෙනුවෙන් 2016 වර්ෂයට හා ඊට පෙර සිට අයවිය යුතු රු.91,700 ක්ද වශයෙන් එකතුව රු.4,830,926 ක් වූ වාරික මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2013 වර්ෂයට රු.395,558 ක්ද, 2014 වර්ෂයට රු.443,390 ක්ද, 2016 වර්ෂයට රු.729,690 ක්ද 2019 වර්ෂයට අදාලව රු.1,449,000 ක මුදලක් ද කපාහැර 2020 වර්ෂයට අදාලව අඩු කිරීමටත් 2018 ජුනි මාසයේ සිට ක්‍රියාත්මක කරන ලද ප්‍රවර්ධන වැඩසටහනේ ඉලක්ක සපුරාලන අලෙවි නියෝජිතයින් හට සියලු ලොතරැයිපත් සඳහා සත 25 ක මුදලක් ලබාදීම සිදුකර ඇත. රු.1,600,000 ක් 2020 වසරට අදාලව කපා හැරීමට සැලසුම් කර ඇත. | වාරික මුදල් අයකර ගැනීම සිදු කිරීමත් අදාළ අනුමැතීන් මත ගැලපීම් කිරීම. |
| (ආ) 2016 වර්ෂයේදී අලෙවි නියෝජිතයින් 20 කට ණයට අලෙවි කළ රු.12,799,984 ක් වූ ක්ෂණික ලොතරැයිපත් වෙනුවෙන් අයවිය යුතු මුදල් 2020 ජුනි 30 දින වන විටත් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇප තැන්පතු රහිතව ආයතනයේ ණය ප්‍රතිපත්ති අනුව ණයට නිකුත් කර ඇත. 2016.12.31 දිනට රු.මිලියන 718 ක ලොතරැයිපත් ණය පදනම මත නිකුත් කිරීම නිසා අයවිය යුතුව තිබූ මිලියන 381 ක ණය මුදලින් තවදුරටත් අයකර ගත යුතුව ඇති මුදල රු.මිලියන 12.69 කි. මුදලින් නිකුත් කළ ලොතරැයිපත් නැවත ලබා ගැනීම මත අඩුවිය යුතු රු.මිලියන 3.1ක මුදල ගැලපූ පසු අයවිය යුතු මුදල වන රු.මිලියන 9.59 ක මුදල තවදුරටත් අයවිය යුතුව ඇත. කඩිනම් ඉදිරි ක්‍රියාමර්ග ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. | රක්ෂණ ගිවිසුම් අනුව කටයුතු කර අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම. |
| (ඇ) 2007 වර්ෂයේ දී මණ්ඩලයේ සේවකයන් දෙදෙනෙකුට රු.1,003,038 ක් වටිනා ලොතරැයිපත් ණයට නිකුත්කර තිබුණද එම මුදල අය වී නොතිබුණි. වර්තමානයේදී එක් නිලධාරියකු සක්‍රීය සේවයේද නොමැති බව වැඩි දුරටත් නිරීක්ෂණය විය. | 2007 වර්ෂයේ ගාල්ල මහාධිකරණයේ නඩුවක් පවරා ඇත. එම අධිකරණ සමථයට අනුව රු.1,000,000/-ක මුදලක් ජාතික ලොතරැයි මණ්ඩලයට ගෙවන ලද අතර, ඩබ්. උයන්ගොඩ යන අය සමථයට එකඟ නොවන බව පසුව අධිකරණයට ප්‍රකාශ කර ඇත. එසේ සමථ නොවීම හේතුවෙන් ඩබ්. උයන්ගොඩ යන අයට විරුද්ධව මහාධිකරණයේ නඩුව විභාග වෙමින් පවතී. | විධිමත් ක්‍රියාමාර්ග අනුව කටයුතු කර ණය අයකර ගැනීම. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති එකතුව රු.273,559,415 ක් වු වෙළද ණයගැති ශේෂ තුළ කලම්බු එයාර්පොර්ට් සුපර් ඩ්‍රෝ ලොතරැයිය වෙනුවෙන් රු.4,662,778 ක්ද අලෙවි නියෝජිතයන්ගෙන් වර්ෂයකට වැඩි කාලයක සිට අයවිය යුතු රු.19,508,730 ක්ද පැවති අතර අලෙවි<br><br>නියෝජිත ශේෂ තුළ මියගිය අලෙවි නියෝජිතයන් දෙදෙනකුගෙන් අයවිය යුතු රු.559,300 ක්ද විය. මෙම වටිනාකම් සම්බන්ධ අවශ්‍ය ගැලපීම් ද සිදු කර නොතිබුණි. | අලෙවි නියෝජිතයන් දෙදෙනෙකු දැනට ජීවතුන් අතර නොමැති බැවින් රු.559,300 ක මුදල අයකර ගැනීමට හැකියාවක් නොමැත. එම ණය මුදල කපා ඉවත් කිරීම සඳහා 2018/05/15 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අවශ්‍ය අනුමැතිය ලබාගැනීම සඳහා 2018/08/03 දින මුදල් අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. | එම |
| (ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලයේ සුභසාධක සංගමයට ණයට නිකුත්කල ලොතරැයිපත් වෙනුවෙන් ලැබිය යුතු මුදල රු.2,559,121 ක් විය. සංගමය ලබාගත් එම ලොතරැයිපත්වලින් රු.1,500,608 ක් වටිනා ක්ෂණික ලොතරැයිපත් කලාප කළමනාකරුවන් 03 දෙනෙකුට හා නිලධාරින් 04 කට ලබාදී තිබුණි. එම ශේෂයන් නිරවුල් කිරීමට විගණිත දින වන විටත් කටයුතු කර නොතිබුණි. | විමල් කුරේ මහතා රු.219,265.94 ක මුදල ඔහුගේ විශ්‍රාම ගෙවීම් වලින් ලබා දීමටත් නිවාස සංවර්ධන අධිකාරියේ ණය මුදල් බේරුම් කරන බවට ඔවුන් ප්‍රකාශ කර ඇති අතර එක් නියෝජිතයෙකුගේ අධ්‍යක්‍ෂක මණ්ඩල තීරණයට අනුව මාසිකව අයකර ගනිමින් පවතියි. කලාප කළමණාකරු ලොතරැයිපත් ලබා දුන් නියෝජිතගෙන් අයකර ගැනීම සඳහා කලාප කළමණාකරු විසින් කටයුතු යොදන බව දන්වා ඇති අතර නොදන්වා සේවය හැරගොස් ඇති අය සම්බන්ධයෙන් සුදුසු ක්‍රියා මාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. | එම |
| (ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති වෙනත් ණය ශේෂ තුල වර්ෂ 9 කට වඩා පැරණි රු.1,317,614 ක්වු ණය ශේෂයක් පැවති අතර ඒ තුළ අක්‍රිය අලෙවි නියෝජිතයන් 70 දෙනෙකුට ගෙවිය යුතු රු.2,758,935 ක් හා ලැබිය යුතු රු.722,731 ක් වු අතර ඒවා නිරවුල් කිරීමටද කටයුතු කර නොතිබුණි. | ගනුදෙනු සිදු නොවන ශේෂ ලෙස සඳහන් වන රු.2,758,935 බැර ශේෂය තුල හඳුනාගත් ණය ශේෂයන් නියෝජිතයින්ගේ හැර ඉතිරි වටිනාකම් ගිණුම්වලින් කපා හැරීමෙන් පසු විවිධ ආදායම් ගිණුමට බැර කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර අමාත්‍යාංශ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. එම අනුමැතිය ලැබුණු පසු ගිණුම් තුල අවශ්‍ය ගැලපීම් සිදු කරනු ලබයි. | එම |
| (උ) ජලය සහ ඉන්ධන සැපයීම වෙනුවෙන් වර්ෂ 06 කට පෙර ආයතනයකට තැන්පත් කර තිබු රු.102,500 ක තැන්පතුද 2004 වර්ෂයේදී හා 2006 වර්ෂයේදී ඉන්ධන ලබා ගැනීමට ආයතන 02 කට ගෙවු රු.160,000 ක් වටිනා ඇප තැන්පතුව ද අදාල ආයතන | මෙම ශේෂ ගිණුම් වලින් ඉවත් කිරීමට අනුමැතිය සඳහා 2018.08.03 වන දින හා 2019.08.27 දින මුදල් අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇත. එබැවින් අදාල අනුමැතිය ලැබු පසු ගිණුම් වලින් ඉවත් කිරීමට බලාපොරොත්තු වේ. | විධිමත් පරිදි සොයාබලා ශේෂයන් නිරවුල් කිරීම**.** |

| | | |
|---|---|---|
| වසා දමා තිබුණද, ඒවා නිරවුල් කර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් ගෙන නොතිබුණි. | | |
| (ඌ) 2016 වර්ෂයට පෙර සිට පැවත එන හඳුනානොගත් රු. 3,585,823 ක බැර ශේෂයක්ද වර්ෂ 09 කට වැඩි කාලයක සිට ණය හිමියන් 04 දෙනකුට ගෙවිය යුතු රු.4,979,245 ක්ද කාර්ය මණ්ඩලයේ 14 දෙනකුට ගෙවිය යුතු රු.169,311 ක මුදලක්ද වූ අතර එම ශේෂ නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | රු.3,585,823 බැර ශේෂය Accpac ගිණුම්කරණ පද්ධතියට අලුතින් අනවශ්‍ය දත්ත ඇතුළත් වීම නිසා සිදුවූ ගනුදෙනු හේතුවෙන් මෙම ශේෂය ඇති වී ඇත. එම ශේෂය ඉවත් කිරිම සඳහා 2018.08.03 දින හා 2019.08.27 වන දිනවලදි මුදල් අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇති බැවින් අනුමැතිය ලැබූ පසු ගිණුම්වලින් ඉවත් කිරීමට බලාපොරොත්තු වේ. | විධිමත් සොයා බැලීමත් කර ශේෂයන් නිරවුල් කිරීම. |
| (එ) 2003 වර්ෂයේදි මියගිය හා වැඩ තහනමට ලක්වූ නිලධාරින් දෙදෙනෙකුට ගෙවිය යුතු රු.240,983 ක් වූ දිරිදීමනා මුදල්ද, වර්ෂ 09 කට පෙර දිස්ත්‍රික් අලෙවි නියෝජිතයන්ගෙන් පරිගණක වාරික වෙනුවෙන් ලැබී තිබූ රු.256,952 ක මුදල්ද, වැඩිපුර ලද පරිගණක වාරිකද නිරවුල් කිරීමකින් තොරව පැවතුණි. | නොගෙවූ දිරි දීමනා නිළධාරීන් දෙදෙනාම වැඩ තහනම් කර අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතී. අනෙක් මුදල් සම්බන්ධයෙන් 2019.08.27 වන දින මුදල් අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇති බැවින් අනුමැතිය ලැබූ පසු ගිණුම්වලින් ඉවත් කිරීමට බලාපොරොත්තු වේ. | විධිමත් සොයා බැලීමත් කර ශේෂයන් නිරවුල් කිරීම. |
| (ඒ) 2018 සැප්තැම්බර් මාසයේදී පවත්වන ලද ගොවිසෙත 1896 විශේෂ 003 දිනුම් වාරයේදී නියෝජිතයකුට ලබාදී තිබූ රු.449,640 ක් වටිනා ලොතරැයිපත් වෙනුවෙන් ලැබිය යුතු මුදල් 2020 ජුනි 30 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | අය විය යුතු ණය මුදල සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | විධිමත් පරිදි සොයාබලා ශේෂයන් නිරවුල් කිරීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

**……………………………………………………………………**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව<br>…………………… | අනුකූල නොවීම<br>………………… | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>………………………………… | නිර්දේශය<br>………… |
|---|---|---|---|
| (අ)1997 අංක 35 දරන මුදල් (සංශෝධිත) පනතින් සංශෝධිත 1963 අංක 11 දරන මුදල් පනත | | | |
| (i) 14 (2) හා 16 (1) හා 16(4) වගන්ති | මණ්ඩලය විසින් වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අධිකාර වෙනුවෙන් ලොතරැයි පැවැත්වීමේදී අදාළ ආයතන සමග ගිවිසුමකට එළඹිය යුතුය. එහෙත්, ගොවිසෙත, සුපිරි වාසනා, ජාතික සම්පත, නීරෝගා හා සෙවණ ලොතරැයි වෙනුවෙන් අදාළ ආයතන සමග ගිවිසුම්ගතවී නොතිබුණි. පනතේ විධිවිධාන ප්‍රකාරව මාස 06 ක ඉක්මවූ හිමිකම් නොපෑ ත්‍යාගවල වටිනාකම ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ ත්‍යාග ලෙස හිමිකම් නොපෑ රු.389,032,360 ක මුදල් ත්‍යාග පමණක් ඒකාබද්ධ අරමුදලට මාරුකර තිබුණි. රු.16,821,648 ක් වූ හිමිකම් නොපෑ මුදල්මය නොවන ද්‍රව්‍යමය ත්‍යාග සම්බන්ධයෙන් කිසිදු පියවරක් අනුගමනය කර නොතිබුණි. එසේම 2013 වර්ෂයේදී ත්‍යාග ප්‍රදානය සඳහා මිලදීගෙන තිබූ රු.2,350,000 ක් වටිනා ජීප් රථයක් සහ 2016 වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.8,500,000 ක් වටිනා වෑන් රථයක් සඳහා ජයග්‍රාහකයන් ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා මණ්ඩලයේ පරිහරණය සඳහා යොදාගෙන තිබුණි. ඒ සඳහා විධිවිධාන ප්‍රකාරව මුදල් අමාත්‍යාංශ අනුමැතිය ගෙන නොතිබුණි. | ජාතික ලොතරැයි මණ්ඩලය වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අධිකාරි වෙනුවෙන් ලොතරැයි පැවැත්වීමේ දී අදාල ආයතන සමග ගිවිසුම් වලට එළඹීමක් සිදු නොකරන්නේ අදාළ මුදල් ඒකාබද්ධ අරමුදලට සෘජුවම බැර කරන බැවිනි. හිමිකම් නොපෑ මුදල් ත්‍යාග සම්බන්ධයෙන් මුදල් පනතේ ප්‍රකාරව අදාල කාල සීමාවෙන් පසු එම මුදල් ඒකාබද්ධ අරමුදල සඳහා බැර කරන අතර ලොතරැයියේ ආරම්භයේ සිට ලබාදෙන භාණ්ඩ ත්‍යාග සම්බන්ධයෙන් හිමිකම් නොපෑ අවස්ථාවල ක්‍රියාකල යුතු ආකාරය විශේෂයෙන් සඳහන්ව නොමැත. ත්‍යාග භාණ්ඩයන් ඒකාබද්ධ අරමුදලට ප්‍රායෝගිකව දායක කරවීමට නොහැකි වීම මත එම ත්‍යාගයන් වෙනත් ඉදිරි දිනුම් වාරයන් සඳහා යොදා ගනු ලබයි.එසේ කීප අවස්ථාවක් දිනුම් වාරයන් කිහිපයක විශේෂ ත්‍යාගයන් ලෙස ඇතුලත් කර ඇති අතර ජීප් රථයක් සහ වෑන් රථයක් ආයතනික අවශ්‍යතාවය මත අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියෙන් ආයතනයේ රාජකාරි කටයුතු වෙනුවෙන් ආයතනයේ වාහන සංචිතයට එකතු කොට නිසි පරිදි ගිණුම් තබා ඇත. | පනතේ දක්වා ඇති පරිදි කටයුතු කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 17(2) වගන්තිය | ලොතරැයි ආදායමින් අදාළ වියදම් අඩුකළ පසු ඉතිරි මුදල ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත් ඉකුත් වර්ෂවලට අදාළව එසේ බැර කිරීමෙන් තොරව 2019 දෙසැම්බර් 31 දිනට රු.1,601,530,457 ක් රඳවා තබාගෙන තිබුණි. | මණ්ඩලයේ ගිණුම්කරණ කටයුතු උපචිත පදනම මත කරන බැවින් ප්‍රවර්තන වර්ෂයේ බදු පසු ලාභය රු.මිලියන 605 වුවත්, වසර අවසානයේ ජංගම වත්කම්, වගකීම් සහ වසර අවසාන මූල්‍යමය තත්ත්වය සලකා බැලීමෙන් පසු භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු මුදල තීරණය කළ හැකි බව දන්වන අතර තවද SITST fund වල තිබූ රු.මිලියන 20 ක මුදල් ප්‍රමාණය භාණ්ඩාගාරයට දැනටමත් ලබාගෙන ඇත. Covid 19 අරමුදලට රු.මිලියන 25 ක දායකත්වයක් ද ලබාදී ඇත. | එම |
| (iii) | 20(2)(1) වගන්තිය | මණ්ඩලය විසින් ලොතරැයි පැවැත්වීම සම්බන්ධයෙන් රීති සකස්කර විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ගැසට් පත්‍රයේ පල කළ යුතු වුවද 2013 වර්ෂයේ සිට හඳුන්වාදී තිබූ නව ලොතරැයි වන මෙගා පවර්, නීරෝගා, ධන නිධානය, සෙවණ හා දරුදිරි සම්පත යනාදි ලොතරැයි සඳහා මේ දක්වා ඒ අනුව කටයුතු කර නොතිබුණි. මෙම ලොතරැයිවලින් රු.6,013,524,440 ක අලෙවි ආදායමක් උපයා තිබුණි. එම ආදායමින් රු.2,919,790,331 ක් ත්‍යාග සඳහා වෙන්කර තිබූ අතර රු.1,164,693,868 ක් අලෙවි නියෝජිත කොමිස් වෙනුවෙන් ගෙවා තිබුණි. | සියලුම ලොතරැයි වල ත්‍යාග රටා වෙනස්කිරීම සම්බන්ධ රීති ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා කටයුතු කරමින් සිටියි. එමෙන්ම ව්‍යාපාර ස්වභාවය අනුව ත්‍යාග රටා වෙනස්කිරීම කෙටිකාලීනව වරින්වර සිදුකිරීම හේතුවෙන් ගැසට් කිරීම ප්‍රායෝගික නොවන බැවින් මණ්ඩලයට අදාළ පනත සංශෝධනය කිරීමේදී අදාළ වගන්තිය සංශෝධනය කර නව වගන්තියක් ඇතුලත් කරන ලෙස නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබාදී ඇත. | ලොතරැයි පැවැත්වීමට අදාළ රීති විධිමත්ව ගැසට් නිවේදන මඟින් ජනතාව දැනුවත් කිරීම. |
| (ආ) | 2009 අංක 8 දරණ මොටර් රථ වාහන (සංශෝධිත) පනතේ 2 (අ)(1)(ඌ) වගන්තිය | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයාගේ පූර්ව ලිඛිත අවසරයක් නොමැතිව විකරණය කිරීම හෝ වාහනයක නිර්මාණය යම් ආකාරයට වෙනස් කළ නොහැකි වුවත් මණ්ඩලය විසින් 2016 වර්ෂයේදී රු.20,750,000 ක් වැයකර මිලදීගත් සිංගල් කැබ් රථ 06 ක බඳ කොටස කැබ් රථයක් ලෙස මතුපිටින් පෙනෙන ලෙස රු.1,625,000 ක් වැයකර නවීකරණයට ලක්කර තිබුණි. | මෙම කැබ්රථ මණ්ඩලීය අලෙවි කටයුතු සඳහා 2017 වසරේදී මිලදී ගෙන ඇත. මෙහි ආසන සංඛ්‍යාව හෝ වෙනත් බඳෙහි ප්‍රධාන වෙනස් කිරීමක් සිදුකර නොමැති බැවින් මෝටර්රථ කොමසාරිස් ජනරාල්ගේ අවසරය ලබා ගැනීමට අවශ්‍යතාවයක් පැන නොනැඟී ඇත. මෙය වාහනයක පූර්ණ බඳ වෙනස් කිරීමක් නොවන බැව් පෙන්වා දෙන අතර මෙහි කැනපි ආවරණය ගලවා පෙර තිබූ තත්වයට ගැනීමටද හැකියාව ඇති බැව්ද පෙන්වා දෙමි. කෙසේ වුවත් එසේ අවශ්‍යය වන්නේ නම්, ඒ පිළිබඳ ඉදිරියේදී මෝටර් රථ | මොටර් වාහන පනතේ විධිවිධාන අනුව කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත පෙන්වා ඒ සඳහා පියවර ගැනීමට කටයුතු කරන බවද දන්වමි. | |
| (ඇ) ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (i) viiiවන පරිච්ඡේදයේ 10.1 ඡේදය හා 10.2 ඡේදය | සති අන්ත හෝ රජයේ නිවාඩු දිනවල රාජකාරීවල නිරත වීම වෙනුවෙන් පැය 08 කට නොඅඩු එක් දිනක් සඳහා වැටුපෙන් 1/20 ක දීමනාවක් ලබාදිය හැකි වුවද එම විධිවිධාන නොසලකා මණ්ඩලය විසින් පැය 12 ඉක්මවා රාජකාරී ඉටුකරන සෑම එක් දිනක්ම දින දෙකක් රාජකාරී කළ සේ සලකා ගෙවීම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ එසේ දින දෙකක් සේ සැලකූ අවස්ථා 18 වෙනුවෙන් ගෙවා තිබූ මුදල රු.70,405 ක් විය. තවද, සතියේ වැඩ කරන දිනයන්ද රජයේ නිවාඩු දිනයන් සේ සලකා නිවාඩු දින වැටුප් ගෙවා තිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතර එසේ ගෙවා තිබූ මුදල රු.84,738 ක් විය. | 2002.09.26 දින අංක 3579 (10) අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුව ගෙවීම් කිරීමට අනුමැතිය ලබා ගෙන ඒ අනුව කටයුතු කරනු ලැබේ. | ආයතන සංග්‍රහයේ පවත්නා නිති රීති අනුව අදාළ අනුමැතින් ලබා ගැනීම. |
| (ii) xxivපරිච්ඡේදයේ 11 වන වගන්තිය සහ 2018 ජනවාරි 23 PE/LO/NLB/COPE/2018 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු ලිපිය | 2005 ජනවාරි 01 දින සිට දේපල ණය ලබා දීම බැංකු මගින් පමණක් සිදු කළ යුතු අතර ඒ පිළිබඳව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින්ද අවධාරණය කර තිබියදීත් ඒ පිළිබඳ නොසලකා සමාලෝචිත වර්ෂයේදී රු.18,215,909 ක දේපල ණය ලෙස මණ්ඩලයේ මුදල් උපයෝගී කර ගෙන ලබාදී තිබුණි. එසේම දේපල ණය සඳහා විධිවිධාන ප්‍රකාරව නිලධාරියාගෙන්, අය කරගත යුතු පොළිය නොසලකා සෑම නිලධාරියෙකුටම සියයට 4 ක අවම පොළී අනුපාතය යටතේ ණය ලබා දී තිබුණි. | 1995 වර්ෂයේ සිට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව ස්ථිර සේවයේ වසර 05 කට වැඩි කාලයක් සේවය කල සේවකයන් හට නිවාස ණය ලබා දීමට කටයුතු කර ඇත. බැංකු මගින් නිවාස ණය ලබා ගැනීමේදී සේවකයන් හට මුහුණ පෑමට සිදුවන දුෂ්කරතා හේතුවෙන් සහ ආයතනයේ ඵලදායීතාවය සඳහා දායක වන සේවකයින්ගේ සුභසාධනය සැලසීමේ අරමුණින් 4% ක පොළිය මත නිවාස ණය ලබා දීම සිදු කර ඇත. මෙමගින් ලැබෙන 4% ක අමතර පොළී ආදායම මණ්ඩලයේ අරමුදල වෙත බැර කරනු ලැබේ. | භාණ්ඩාගාර උපදෙස් අනුව කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (iii) xxiv පරිච්ඡේදය | අනුමත විධිමත් බඳවා ගැනීමේ පරිපාටියට සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන නොසලකා මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී අලෙවිකරණ/ ප්‍රවර්ධන තනතුර සඳහා අයකු බඳවාගෙන 2018 ඔක්තෝබර් 01 දින සිට මේ දක්වා වැටුප් හා දීමනා ගෙවමින් පැවතුණි. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ/ප්‍රවර්ධන) තනතුර සඳහා බඳවා ගැනීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් ලබා ගැනීම සඳහා වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත ඉදිරි කටයුතු කරනු ලැබේ. | අනුමත බඳවාගැනීමේ පරිපාටිය අනුව අදාළ බඳවැගැනීම් සිදු කිරීම. |
| (ඇ) ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 394 | මණ්ඩලය විසින් ලබාගත් සේවාවන් සහ අනෙකුත් වියදම් සඳහා ගෙවීම් වෙනුවෙන් නිකුත් කර තිබූ රු.3,400,584 ක් වටිනා චෙක්පත් 420 ක් අදාළ ගෙවීම් ලාභීන්ට ලබා නොදී ආයතනය තුලම රඳවාගෙන අවලංගු කර තිබුණි. | අලෙවි නියෝජිතයින්ට ගෙවිය යුතු දීමනා ගෙවීමේදි එම ගෙවීම් වලට අදාල ගිණුම් අක්‍රිය වීම,ගිණුම් අංක නිවැරදි නොවීම ආදී හේතු නිසා චෙක්පත් අවලංගු කිරිමට හේතු වී ඇත. පසුගිය කාලය තුල මෙම ගෙවීම් Slip Transfer මඟින් සිදු නොවූ හෙයින් විශාල චෙක්පත් ප්‍රමාණයක් නිකුත් වි ඇති අතර අවලංගු වූ චෙක්පත් ප්‍රමාණයද බොහොමයක් වි ඇත. වර්තමානයේ එම ගෙවීම් Slip Transfer හරහා සිදු වන බැවින් මෙසේ විශාල චෙක්පත් ප්‍රමාණයක් අවලංගු වීමක් දක්නට නොමැත. ඉදිරියේදී මෙම ශේෂයන් ගිණුම් ප්‍රකාශන වල ගැලපීම් සිදු කිරිමට අවශ්‍ය පියවර ගන්නා බව දන්වමි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීම. |
| (ii) මුදල් රෙගුලාසි 702 (3) | කොන්ත්‍රාත් ගිවිසුම් පිටපතක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ලොතරැයි මුද්‍රණය, ප්‍රචාරණය හා භාණ්ඩ හා සේවා සැපයීම සම්බන්ධයෙන් වූ ගිවිසුම් සඳහා එසේ කටයුතු කර නොතිබුණි. | ඇතැම් ගිවිසුම් වල පිටපත් ඉදිරිපත් කර ඇති අතර ඉදිරියේදී ලොතරැයි මුද්‍රණය, ප්‍රචාරණ සහ භාණ්ඩ හා සේවා සැපයුම් ගිවිසුම් වල පිටපත්ද ලබා දීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (iii) මුදල් රෙගුලාසි 754,756,75 හා 7,758 770 | විධිවිධාන ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 754 යටතේ ගබඩා භාර නිලධාරීන් විසින් ගිණුම් පොත් තුලනය කිරීම සම්බන්ධයෙන් කටයුතු කර ඇති අතර මුදල් රෙගුලාසි 756 යටතේ පොදුවේ වත්කම් සමීක්ෂණය සඳහා සමීක්ෂණ මණ්ඩලයක් පත්කරනු ලබන අතර ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩද එම මණ්ඩලය විසින් සකස් කරනු ලැබේ. මුදල් රෙගුලාසි 757 ට අනුව ගබඩා භාර නිලධාරීන් තුලනය කරන ලද භාණ්ඩ ලේඛණ සමීක්ෂණ මණ්ඩලය විසින් පරීක්ෂා කර අත්සන් තබා ඇත එමෙන්ම මුදල් රෙගුලාසි 758 ට අනුව ගබඩා අංශය විසින් මාසිකව තොග ශේෂ ගණනය සිදු කරන අතර ඉදිරියේදි එය තෙමසකට වරක් පරීක්ෂා කිරීම සඳහා අදාල අංශය දැනුවත් කර ඇත. මුදල් රෙගුලාසි 770 යටතේ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ D අක්ෂරයෙන්ද, ප්‍රතිසංස්කරණය කර නැවත ප්‍රයෝජනයට ගත හැකි භාණ්ඩ හදුනාගැනීම සඳහා R අකුරද යොදා සමීක්ෂණ වාර්තා සකස්කර ඇත. ඉදිරියේදී තවදුරටත් එය විධිමත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීම. |
| (ඉ) 2011 පෙබරවාරි 9 දිනැති අංක 13/2008 (iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2015 මැයි 25 දිනැති අංක 01 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | (i) නිල වාහන සඳහා හිමිකම ඇති නිලධාරීන් 04 දෙනෙකු වෙනුවෙන් මාසිකව ලබාදිය හැකි ඉන්ධන දීමනා සීමාව ඉක්මවා රු.1,812,130 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ලබා දෙන ලද එම ඉන්ධන දීමනාව මේ වනවිට චක්‍රලේඛයට අදාලව නිවැරදි කර ඇත. | මුදල් අමාත්‍යාංශය අනුමැතිය ලිඛිතව අනුමත කරවා ගැනීමට කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| | (ii) නිල වාහන හිමිකම් නොමැති කලාප කළමනාකරුවන් 24 ක් සහ අලෙවි ප්‍රවර්ධන නිලධාරීන් 17 ක් සඳහා ඉන්ධන දීමනාවක්ද තමාගේ පුද්ගලික වාහනය භාවිතා කරන්නේ නම් අතිරේක මාසිකව දීමනාවක් ද ලෙස වැටුපට එකතු කර සමාලෝචිත වර්ෂය තුළදී රු.14,993,976 ක දීමනා ගෙවා තිබුණි. | කලාප කළමනාකරුවකුට මාසිකව රු. 25,000 ක උපරිමයකට හා එක් අලෙවි ප්‍රවර්ධන නිලධාරියෙකුට මාසිකව ඉන්ධන ලීටර් 25 ක උපරිමයකට යටත්ව රාජකාරි අවශ්‍යතාවයන් වෙනුවෙන් පමණක් ධාවනය කර ඇති කිලෝමීටර් ප්‍රමාණය ගණනය කර ලබා දෙන ඉන්ධන දීමනාව ඇතුළු අනෙකුත් දීමනාවන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ලබා දී ඇත. මේ සම්බන්ධව මුදල් අමාත්‍යාංශය වෙත ලිපියක්ද යවා අතර අමාත්‍යාංශ අනුමැතිය ඉදිරියේදී ලැබෙනු ඇති බව අපේක්ෂා කරයි. | මුදල් අමාත්‍යාංශය අනුමැතිය ලිඛිතව අනුමත කරවා ගැනීමට කටයුතු කිරීම. |
| | (iii) මුදල් අමාත්‍යාංශය වෙත නිදහස් කළ නිලධාරියකුට සමාලෝචිත වර්ෂයේදි රු.140,000 ක මුදලක් ඉන්ධන දීමනා වශයෙන් ගෙවා තිබුණි. | මුදල් අමාත්‍යාංශය වෙත නිදහස් කර සිටි නිලධාරීන් තිදෙනා සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ඉන්ධන දීමනාව ලබා දී ඇත. | මුදල් අමාත්‍යාංශය අනුමැතිය ලිඛිතව අනුමත කරවා ගැනීමට කටයුතු කිරීම. |
| (ඊ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ<br>(i) ජුනි 2003 දිනැති 02 අංක 12/පීඊඩී දරන චක්‍රලේඛය<br>• 8.3.9 ඡේදය | මණ්ඩලය සතු සම්පත් රේඛීය අමාත්‍යාංශය හෝ වෙනත් රාජ්‍ය ආයතන සඳහා ලබා නොදිය යුතු වුවද ඊට පටහැනිව මණ්ඩලයේ නිලධාරීන් 06 දෙනෙකු සහ රු.20,126,786 වටිනා මෝටර් වාහන 04 ක් මුදල් අමාත්‍යාංශය සඳහා සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට මුදා හැර තිබුණි. තවද, එම නිලධාරීන් වෙත මණ්ඩලයෙන් ගෙවා තිබූ සේවක පාරිශ්‍රමික හා දිරි දීමනා මුදල වූ රු.2,050,000 ක් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් අමාත්‍යාංශය වෙත නිදහස් කරන ලද නිලධාරීන්ගේ භාවිතය සඳහා මෝටර් වාහන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත මුදා හැර ඇති අතර මේ වනවිට එම මෝටර් වාහන, ජාතික ලොතරැයි මණ්ඩලය වෙත භාර දී ඇත. එම කාර්යමණ්ඩලය විසින් ඉටුකරන ලද රාජකාරීන් සඳහා වැටුප් ලබාදීම අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ සිදු කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ඉන්ධන දීමනාවක් ලබා දී ඇත. නමුත් නැවත එම මුදල් ප්‍රතිපූර්ණය කිරීමක් සිදු නොකෙරේ. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| • 9.12 ඡේදය | (i) | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව 2006 වර්ෂයේ මණ්ඩලය විසින් අසරණ සරණ නමින් අරමුදලක් ආරම්භ කර ඒ සඳහා ලොතරැයි ත්‍යාග ලාභීන්ගේ පරිත්‍යාග සහ නීරෝගා ලොතරැයි අලෙවි ආදායමෙන් සියයට 0.05 ක ප්‍රතිශතයක් බැර කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට එම අරමුදලේ රු.181,199,942 ක ශේෂයක් පැවතුණි. | අසරණ සරණ අරමුදල ත්‍යාගලාභීන්ගේ පරිත්‍යාග තුළින් අසරණ වූ ජනතාවට සහන සැලසීමේ පරමාර්ථයෙන් 1998 වසරේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ආරම්භ කර ඇත. අමාත්‍යාංශ අනුමැතිය ලබා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. නීරෝගා ලොතරැයිපතින් ලබා දිය යුතුව තිබූ විකුණුම් ආදායමෙන් 0.05 ක ප්‍රතිශතය මෙම අරමුදලට බැර කිරීම සිදු කරයි. | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම. |
| | (ii) | මණ්ඩලයේ සභාපතිගේ අනුමැතිය මත කාර්ය මණ්ඩලය සඳහා සමාලෝචිත වර්ෂය සඳහා රු.7,695,000 ක සුභසාධක දීමනාවක් ගෙවා තිබුණද ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. මෙම දීමනාව ඉකුත් වර්ෂවලදීද ගෙවා තිබුණි. | 2007 වසරේ සිට අප්‍රේල් මස සිංහල අවුරුද්ද සහ නත්තල් උත්සවය පදනම් කර ගෙන සුභ සාධක සංගමයේ සාමාජිකත්වය දරන සියළු සේවක මණ්ඩලය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මෙම දීමනාව ලබා දී ඇත. | භාණ්ඩාගාර අනුමැතිය මත කටයුතු කිරීම. |
| (ii) 1994 ජුනි 14 දිනැති අංක 95 දරණ චක්‍රලේඛය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ චක්‍රලේඛය | (i) | භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කාර්ය මණ්ඩලය සඳහා දිරිදීමනා යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණ අතර සමාලෝචිත වර්ෂයේ දිරිදීමනා ලෙස එසේ ගෙවා ඇති මුදල රු 105,509,897.ක් විය. | ජාතික ලොතරැයි මණ්ඩලය අතිගරු ජනාධිපතිතුමා යටතේ පැවති කාලය තුළ ජනාධිපති කාර්යාලයේ අනුමැතිය මත මෙම දිරි දීමනා ලබා දී ඇත. එමෙන්ම ජාතික ලොතරැයි මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා ලබා දෙන දිරි දීමනාව වැඩිකර ගැනීම සඳහා කරන ලද ඉල්ලීමට අනුව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මඟින් ආදායම වැඩිකර ගැනීම තුළින් දිරිදීමනා වැඩිකර ගත යුතු බවට යෝජනා කර ඇත. | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම. |
| | (ii) | රජයේ අනුමත සංයුක්ත දීමනාව වෙනුවට එක් දිනකට උපරිම ලෙස රු.3,000 දක්වා වූ විශේෂ ප්‍රවර්ධන දීමනාවක් කාර්ය මණ්ඩලයට ලබාගත හැකි වන පරිදි විධිවිධාන සලසා තිබුණද ඒ සඳහා නිශ්චිත අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී එසේ ගෙවා ඇති මුදල රු.5,791,000 ක් විය. | විශේෂ ප්‍රවර්ධන හා විශේෂ රාජකාරි සඳහා දීමනා ගෙවීම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව සිදු කරනු ලැබේ. | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| | (iii) මණ්ඩලයේ සේවයේ නියුතු කළාප කළමණාකරුවන් හා අලෙවි ප්‍රවර්ධන නිලධාරීන් වෙත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අතිකාල දීමනා, සංයුක්ත දීමනා හා දුරකථන දීමනා වශයෙන් රු.5,309,879 ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ගෙවා තිබුණි. | අතිකාල සහ සංයුක්ත දීමනාව හා දුරකථන දීමනාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම. |
| (iii) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී/2/2015 දරන චක්‍රලේඛය | චක්‍රලේඛය මඟින් අනුමත දුරකථන සීමාව ඉක්මවා මණ්ඩලය විසින් සීමාවන් ලබාදී තිබුණි. ඒ අනුව නිලධාරීන් 05 ක් විසින් අනුමත සීමාව ඉක්මවා ලබාගත් ඇමතුම් වෙනුවෙන් රු.25,500 ක් මණ්ඩලය විසින් දරා තිබුණි. මේ වෙනුවෙන් අවශ්‍ය අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2010.09.01 දිනැති අංක 446 දරන රජයේ චක්‍රලේඛයට අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ගෙවීම් සිදු කරනු ලබන අතර නැවත සංශෝධනය කිරීමක් සිදු කර නොමැත. | චක්‍රලේඛවල සඳහන් සීමාව මත කටයුතු කිරීම. |
| (iv) 2015 ජුනි 17 දිනැති අංක පීඊඩී/03/2015 දරන චක්‍රලේඛයේ ඡේදය 2.5 | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව මණ්ඩලය විසින් සභාපති හා ක්‍රියාකාරී අධ්‍යක්ෂක වෙත සමාලෝචිත වර්ෂය තුළදී රු.413,023 ක් දිරිදීමනා හා ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණි. | ආයතනයේ කටයුතු වලට සහායවීම, සියළුම ලිපිලේඛන වලට අත්සන් තැබීම, රැස්වීම් සඳහා සහභාගීවීම ආදී භාරදූර කාර්යයන් රැසක් ඉටු කරන බැවින් ජාතික ලොතරැයි මණ්ඩලයේ සියළුම කාර්යය මණ්ඩලය වෙත හිමි මෙම දිරිදීමනාව ආයතනයේ දියුණුව සඳහා වගකීමකින් යුක්තව කටයුතු කරන බැවින් මණ්ඩලයේ සභාපතිට ලබාදීම සිදු කරනු ලැබේ | භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීම. |
| (v) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10 වන වගන්තිය | 2019 වර්ෂයේදී මණ්ඩලයට අයත් මොටර් රථ 4 ක් අලෙවිකර ලැබූ රු.6,688,650 ක් වූ ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | 2019 වසරේදී අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අනුමැතිය හා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගෙන ඇත. වාහන විකුණූ මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කර නොමැත. ඉදිරියේදී අවස්ථා වලදී භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව කටයුතු කරනු ඇත. | භාණ්ඩාගාර චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කිරීම. |
| (vi) 2011 පෙබරවාරි 11 දිනැති අංක 57 දරන රාජ්‍ය ව්‍යාපාරචක්‍ර ලේඛය | මණ්ඩලය විසින් වාර්ෂික ප්‍රචාරණ සැලැස්මක් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ප්‍රචාරණ වියදම් වශයෙන් රු.1,037,345,636 ක් ගෙවා තිබූ අතර ඉකුත් වර්ෂයේදීද එසේ ගෙවා | අලෙවිකරණ අංශයෙන් පිළියෙල කරන වාර්ෂික ප්‍රචාරණ අයවැය ඇතුලත් සැලැස්මක් පිළියෙල කර එය මණ්ඩලයේ සමස්ථ අයවැය ලේඛනය තුල අන්තර්ගත කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමුකර අනුමැතිය ලබා ගත් පසු රාජ්‍ය | භාණ්ඩාගාර චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| | තිබුණු මුදල රු.1,023,507,765 ක් එසේ දරා තිබුණි. | ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ හා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා යොමු කිරීම සිදුකර ඇත. | |
| (උ)1993 ජනවාරි 21 දිනැති අංක PE1/70/7/Vo11 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය | රජය වෙනුවෙන් පවත්වනු ලබන සියලු ලොතරැයි ආදායමෙන් සියයට 16.5 ක ප්‍රතිශතයක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුලදී පවත්වා තිබූ මෙගා පවර් හා ධන නිධානය යන ලොතරැයි වර්ග 02 කින් නියමිත ප්‍රතිශතයට වඩා අඩුවෙන් එනම් සියයට 10 ක වටිනාකමක් ප්‍රේෂණය කිරීම නිසා තවදුරටත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකළ වටිනාකම රු. 245,317,469 ක් විය. | ජාතික ලොතරැයි මණ්ඩලය පවත්වා ගෙන යනු ලබන සියලු ලොතරැයිපත් වලින් රජයේ ඒකාබද්ධ අරමුදල වෙත බැර කරනු ලබන ප්‍රතිශතයන් වෙනුවෙන් අමාත්‍යාංශ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත. | භාණ්ඩාගාර උපදෙස් අනුව නියමිත ප්‍රතිශතයන් ප්‍රේෂණය කිරීම. |
| (ඌ)2017 ඔක්තොබර් 25 දිනැති අංක 05/2017 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය 2(ii) ඡේදය | විධිවිධාන ප්‍රකාරව වෙනත් දීමනා ලබන නිලධාරීන්ට වෘත්තිය දීමනාවක් ගෙවීමට හිමිකමක් නොමැති වුවද මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරි තනතුරට මුදාහල නිලධාරියෙකුට මසකට රු.15,000 බැගින් 2017 ඔක්තෝබර් සිට 2019 ජූනි දක්වා වූ කාලය තුලදී රු.315,000 ක වෘත්තීය දීමනාවක් ගෙවා තිබුණි. | මුදල් අමාත්‍යාංශයේ උපදෙස් ලබා ගැනීමෙන් පසු එම දීමනාවට හිමිකම් නොමැති බව දන්වා ඇත. ඒ අනුව මෙම නිලධාරිවරයා වෙත ලබා දුන් මෙම දීමනාව අය කර ගැනීමට කටයුතු සූදානම් කර ඇත. | වැඩිපුර ගෙවීම් නැවත අයකර ගැනීමට කටයුතු කිරීම. |

## 1.8 මුදල් කළමනාකරණය

........................

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>........................ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>........................................ | නිර්දේශය<br>............... |
|---|---|---|
| (අ) මණ්ඩලයේ බැංකු ගිණුමට වියදම් ලෙස හරකර තිබූ රු.85,127 ක්ද ලැබීම් ලෙස බැරකර තිබූ රු.284,544 ක මුදලක්ද වර්ෂ 04 කට වඩා වැඩි කාලයක සිට නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි | 2019.12.31 දිනට ජංගම ගිණුම් වල හර සහ බැර ශේෂයන් මේ වන විට බොහොමයක් විසඳී ඇත. | නිවැරදි කිරීම් නොපමාව සිදු කිරීම. |
| (ආ) මණ්ඩලය විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන රැස්කිරීමේ ගිණුමට අලෙවි නියොජිතයින් විසින් මුදල් තැන්පත් කිරිමේදී බැංකුව විසින් සියයට 0.045 සේවා ගාස්තුවක් අයකර තිබුණි. එම ගාස්තු ගණනය පිළිබඳ | මෙහි දක්වා ඇති පරිදි මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන රැස් කිරීමේ ගිණුමට කිසිදු ගාස්තුවක් අය නොකරයි. මහජන බැංකුව විසින් ජාතික ලොතරැයි මණ්ඩලය තුල පවත්වාගෙන යන බැංකු ශාඛාවෙහි වියදම් ආවරණය සඳහා බැංකුව ගාස්තුවක් අය කරයි. | ගාස්තු අයකිරීමකින් තොරව නියෝජිත ලැබීම ලබා ගැනීමට කටයුතු කිරීම. |

| | |
|---|---|
| තොරතුරු මණ්ඩලය සතු නොවූ අතර ඒ සඳහා ලිඛිත ගිවිසුමක් මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ද ඉදිරිපත් නොවුණි. 2019 වර්ෂය වෙනුවෙන් බැංකුව අයකළ ගාස්තුව රු.24,577,338 ක් වූ අතර පසුගිය වර්ෂ 05 තුළදී එසේ ගෙවා තිබූ ගාස්තුව රු.213,034,815 ක් විය. මෙම ගාස්තුව අඩුකර ගැනීම සම්බන්ධ ක්‍රියාමාර්ගයක් ලෙස පෞද්ගලික හා රාජ්‍ය බැංකුවක ගාස්තුවකින් තොරව රැස් කිරීමේ ගිණුම් ආරම්භ කර තැබීම කර තිබුණද ගාස්තු අය කරන බැංකුවේ රැස්කිරීම් අඛණ්ඩව සිදු කරමින් පැවති බව විගණනයේ දී නිරීක්ෂණය විය. | මෙම බැංකු ගාස්තු අය කිරිම සඳහා බැංකුව විසින් පදනම් කර ගන්නේ මුළු දිවයිනේම රැස් කිරිමේ ගිණුමෙහි තැන්පතු නොව මහජන බැංකුවේ ලිබර්ටි ප්ලාසා ශාඛාවේහි සිදු කරනු ලබන තැන්පතු සඳහා පමණි.(මීට අමතරව මලියදේව ශාඛාව විසින් 0.5% ක් අය කරයි) මෙම බැංකු ගාස්තු ප්‍රමාණය අඩු කර ගැනිම සඳහා ක්‍රියා මාර්ග ගෙන ඇති අතර ඒ අනුව බැංකුව සමඟ සාකච්ඡා කර ප්‍රතිශතය 0.05 - 0.045 දක්වා අඩු කරගෙන ඇත. මීට අමතරව ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලියේ වෙනස්කම් කිහිපයක් සිදු කර බැංකු ගාස්තු අඩු කරගැනීමට කටයුතු කර ඇත. මීට අමතරව රැස්කිරිම මත පදනම්ව නොව ස්ථාවර බැංකු ගාස්තුවක් යටතේ ශාඛාව පවත්වාගෙන යාම සඳහා සාකච්ඡා කරගෙන යනු ලැබේ. |

## 1.9 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් එහි ගිණුම් කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් 2003 වර්ෂයේදී හඳුන්වා දී තිබූ මධ්‍යගත Sage ACCPAC නැමැති පරිගණක මෘදුකාංගය 2016 වර්ෂයේදී වි මධ්‍යගත කර තිබීම හේතුවෙන් එම මෘදුකාංගයෙන් ලබාගත හැකි සේවාවන් සීමිත වී තිබුණි. කලින් පැවති මධ්‍යගත ක්‍රමය මගින් ආයතනයේ ගනුදෙනු පිළිබඳව පැවති විශ්වාසනීයත්වයද මෙම විමධ්‍යගත ක්‍රමය යටතේ ප්‍රශ්නගත වී තිබුණු අතර, අදාළ වෙනස් කිරීම් නිසා ඇතිවන අවදානම්වල වගකීම භාර ගැනීම මෙම මෘදුකාංගය හඳුන්වාදුන් සමාගමද ප්‍රතික්ෂේප කර තිබුණි. | මධ්‍යගත Sage Accpac පරිගණක මෘදුකාංගය භාවිතා කිරීමේදී සිදුවූ ණයහිමි පාලක ගිණුමේ ශේෂයක් දැනටමත් ප්‍රධාන ජ'නලයේ ඉතිරිවී ඇත .මෙවැනි ගණුදෙනු ඉදිරියේදී සිදුවීම වළක්වා ගැනීම සඳහා Accpac පද්ධතියට අලුතින් එකතු කරන ලද පරිගණක මෘදුකාංගයන් ප්‍රධාන ජර්නලයෙන් ඉවත් කර වෙන් වෙන් වශයෙන් මෘදුකාංගයන් ලෙස දැනට භාවිතා කරයි. ඒ අනුව විමධ්‍යගත කරන ලද පරිගණක පද්ධතිය හේතුවෙන් වඩාත් නිවැරදිව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට හැකි වී තිබේ. | පරිගණක මෘදුකාංගයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පාලන පරිසරය සකස් කිරීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

| | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| බදු පසු ශුද්ධ ලාභය (ලාභාංශ ගෙවීමට පෙර) | 978,585,273 | 38,092,926 | 139,805,208 | 414,761,431 | 241,016,039 |
| සේවක පාරිශ්‍රමික | 458,633,719 | 420,862,040 | 375,410,032 | 380,279,707 | 320,462,652 |
| <u>රජයට ගෙවූ බදු</u> | | | | | |
| ආදායම් බදු | 717,469,811 | 1,174,402,368 | 484,610,312 | 482,128,237 | 669,785,229 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 281,800,099 | 286,551,044 | 235,767,246 | 285,776,997 | 253,267,754 |
| එකතු කළ අගය මත බදු | 911,198,767 | 890,352,095 | 742,298,500 | 706,868,280 | 573,252,862 |
| ඒකාබද්ධ අරමුදලට සිදු කළ දායකත්වය | 2,637,962,104 | 2,426,947,888 | 2,016,986,336 | 2,445,594,544 | 2,130,953,970 |
| <u>ක්ෂය වීම</u> | | | | | |
| මෝටර් රථ ක්ෂය වීම් | 27,022,836 | 19,290,936 | 55,627,510 | 54,979,532 | 48,727,716 |
| අනෙකුත් ක්ෂය වීම් | 53,260,748 | 60,229,778 | 70,474,209 | 68,497,174 | 60,061,990 |
| | 6,065,933,417 | 5,142,368,354 | 4,120,979,353 | 4,838,885,902 | 4,297,528,212 |

ඉදිරිපත් කරල ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ලාභය රු.978,585,273 ක් විය. 2018 වර්ෂයේදී විගණනය විසින් පෙන්වා දී තිබූ දෝෂ නිවැරදි කර එම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නැවත සකස්කර තිබුණු අතර ඒ අනුව එම වර්ෂයේ අලාභය රු.98,174,870 කින් අඩු වීම හේතුවෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.38,092,926 ක අලාභයක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,016,678,199 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සහ රජයට ගෙවූ බදු නැවත ගැලපීමේදී 2015 වර්ෂයේ සහ 2017 වර්ෂයේ දායකත්වයේ අඩු වීමක්ද 2016,2018 සහ 2019 වර්ෂවල වර්ධනයක්ද නිරීක්ෂණය විය.

### 2.2 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ මණ්ඩලයේ ලාභදායීත්ව හා කාරක ප්‍රාග්ධන අනුපාත පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ .

| අනුපාතය | වර්ෂය | |
|---|---|---|
| | 2019 | 2018 |
| (i)දළ ලාභ (ප්‍රතිශතය) | 14.09 | 14.45 |
| (ii)ශුද්ධ ලාභ/(අලාභ) (ප්‍රතිශතය) | 4.43 | -0.18 |
| (iii)ජංගම වත්කම් අනුපාතය | 2.20:1 | 1.80:1 |
| (iv)ක්ෂණික වත්කම් අනුපාතය | 2.18:1 | 1.78:1 |

2018 වර්ෂයේදී ඒකාබද්ධ අරමුදලට සහ ජාතික වකුගඩු අරමුදලට සිදු කළ ප්‍රේෂණයන් මත ගෙවීමට සිදු වූ බදු මුදල එම අරමුදල්වලින් ආපසු ලබා ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභ ප්‍රතිශතය මෙන්ම ජංගම හා ක්ෂණික වත්කම් අනුපාතයන්ද ඉහළ ගොස් තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආයතනයේ නෛතික සේවාවක් සඳහා තනතුරක් ඇතිකර ඒ සඳහා නීති නිලධාරියෙකු බඳවාගෙන සිටියද මණ්ඩලයේ විවිධ නීති සේවා ප්‍රසම්පාදනයකින් තොරව බාහිර නීතිඥ ආයතන මගින් සිදුකරවා ගෙන තිබුණි. තවද අදාල නීති සේවාවන් නීතිපති දෙපාර්තමේන්තුව මගින්ද ලබාගැනීමේ හැකියාව පිළිබඳ සොයා බලා නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දී එසේ ලබාගත් නීති සේවාව වෙනුවෙන් රු.3,108,097 ක් වැයකර තිබුණි. තවද කොළඹ වාණිජ මහාධිකරණයේ විභාග වන එක් නඩුවක එක් එක් නඩුවාරය සඳහා නීතිඥ මහත්වරුන් තිදෙනෙකු බැගින් යොදවා ගාස්තු ගෙවා ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය. එම නඩුවේ නඩුවාර 05 ක් සඳහා ගෙවා ඇති නීතිඥ ගාස්තුව රු.459,275 ක් විය. | අවශ්‍යතාවය සලකා බලා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥ සේවාව හෝ ජාතික ලොතරැයි මණ්ඩලයේ ලියාපදිංචි නීතිඥ මණ්ඩලයේ (Panel of Lawyers ) නිතිඥවරයකුගේ සේවාව ලබා ගැනීමට තීරණය කෙරේ.<br>කොළඹ වාණිජ මහාධිකරණයේ විභාග වන නඩුව වෙනුවෙන් නීතිඥවරුන් තිදෙනෙකු යොදවා ඇත. ජනාධිපති නීතිඥවරයකු අධිකරණයේ පෙනී සිටීමේදී කණිෂ්ඨ නීතිඥවරයකු සමඟ පෙනී සිටීම අනිවාර්ය වේ. එබැවින් එම ජනාධිපති නීතිඥවරයා කණිෂ්ඨ නීතිඥවරයකු සමඟ එම නඩුවට පෙනී සිටින අතර අනෙක් නීතිඥවරයා එම නඩුවේ ලේඛනගත නීතිඥ ලෙස කටයුතු කරයි . | නීතිපති විමසා අදාළ නෛතික කටයුතු සිදු කිරීම. |
| (ආ) අලෙවි නියෝජිතයින් විසින් ආපසු එවනු ලබන ලොතරැයිපත් වෙනුවෙන් නැවත වතාවක් ලොතරැයිපත් නිකුත් කිරීමේදී, මණ්ඩලය විසින් බැංකුව වෙත ප්‍රතිපූර්ණ වවුචරයක් (Return Reimbursement Voucher) පිළියෙල කර නියෝජිත ආපසු එවුම්වලට අදාළ ගැලපීම් බැංකු ගිණුම් හරහා සිදු කිරීම බැංකුව වෙත භාරදෙනු ලබයි. එම නිසා බැංකුව ඒ සඳහා ද සියයට 0.045 එකතු කොමිස් මුදලක් අයකර තිබිණි. ඒ අනුව 2014 වර්ෂයේ සිට 2020 ජුනි දක්වා කාලයට එලෙස දෙවරක් ගෙවූ කොමිස් මුදල රු.18,220,437 ක් වී තිබූ අතර එම ගණනය කිරීමට අදාල තොරතුරු හා උපලේඛන විගණනයට ඉදිරිපත් නොවූ අතර එම මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී සොයා බලා කටයුතු කරනු ලැබේ. | මූල්‍ය අලාභය අයකර ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) නිර්මාණාත්මක ප්‍රචාරණ නියෝජිත ආයතන විසින් නිෂ්පාදනය හා සංස්කරණය නිමකර මණ්ඩලයට ඉදිරිපත් කරන ප්‍රචාරණ දැන්වීමට අදාල සියළුම ගෙවීම් කිරීමෙන් පසුව ද, එම දැන්වීම් අදාල මාධ්‍යයන්වල ප්‍රචාරණය වන සෑම වාරයක් පාසාම එම ප්‍රචාරණ ආයතනයට මුළු සේවා ගාස්තුවෙන් සියයට 11.5 ක් අනාර්ථිකව ගෙවීම් කරමින් පැවතුණි. 2019 වර්ෂය තුළදී පමණක් එලෙස රු.40,810,083 ක් ගෙවා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන ක්‍රමවේදය හරහා මෙම නියෝජිත ආයතන බඳවාගෙන ඇති අතර ගිවිසගෙන තිබූ ගිවිසුම් අනුව ගෙවීම් කටයුතු සම්බන්ධයෙන් කර තිබූ නිර්වචනයන්ට අනුකූලව කටයුතු කර ඇත. මෙම 11.5% කොමිස් මුදල නොගෙවා කටයුතු කිරීමට නම් නියෝජිත ආයතන වලින් බැහැරව කටයුතු කල යුතු අතර එය ප්‍රයෝගික නොවන අතර මෙම කොමිස් මුදල ගෙවීම අලෙවිකරණ ක්ෂේත්‍රය තුල සිදු කෙරෙන සාමාන්‍ය ක්‍රමවේදයයි. | ගිවිසුම් සංශෝධනයකර අදාළ ආර්ථික ප්‍රතිලාභය ආයතනවල ලබා ගැනීමට කටයුතු කිරීම. |
| (ඈ) ප්‍රචාරණ ආයතන නිර්මාණය කල විද්‍යුත් ප්‍රචාරණ දැන්වීම්වල අයිතිය මණ්ඩලය සතු කර ගැනීමේ දුර්වලතා නිසා නව ප්‍රචාරණ ආයතන විසින් පැරණි ප්‍රචාරණ ආයතන නිෂ්පාදනය කරන ලද දැන්වීම් නැවත විකාශයට භාවිතා කිරීමේදී නව ප්‍රචාරණ ආයතනයට එම දැන්වීම් විකාශන ගාස්තුවෙන් සියයට 11.5 ක අනාර්ථික ගෙවීමක් සිදුකරන බව විගණනයේදී නිරීක්ෂණය විය. ඒ අනුව 2019 ඔක්තොබර් 01 සිට දෙසැම්බර් 31 දක්වා කාලයට අදාලව එසේ ගෙවා තිබූ මුදල රු.7,371,544 ක් වී තිබුණි | ප්‍රසම්පාදන ක්‍රමවේදය හරහා නව නියෝජිත ආයතන බඳවාගෙන කටයුතු කිරීමේ දී පැරණි දැන්වීම් නියෝජිත ආයතන විසින් නිර්මාණය කරන ලද විද්‍යුත් ප්‍රචාරණ දැන්වීම් වල සිදුවන සංස්කරණ නව දැන්වීම් නියෝජිත ආයතනය මඟින් සිදුකල යුතුය. එබැවින් පැරණි දැන්වීම් නියෝජිත ආයතන වල විද්‍යුත් ප්‍රචාරණ දැන්වීම් විකාශය වීම් සඳහා විකාශන ගාස්තුවෙන් 11.5% මුදලක් ගෙවීමට ගිවිසගෙන තිබෙන ගිවිසුමට අනුව කටයුතු කර ඇත. මුල් නිෂ්පාදනයේ වෙනසක් නොවන සියලුම නිෂ්පාදන ඍජුවම මාධ්‍ය වෙත මුදාහැර මාධ්‍ය සම්බන්ධීකරණ ආයතනයේ කොමිස් මුදල වන 3.5% පමණක් ගෙවීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. | ආර්ථිකමය වශයෙන් වාසිදායක වන අයුරින් මණ්ඩලය විසින්ම සිදු කිරීම. |
| (ඉ) ජාතික ලොතරැයි මණ්ඩලයේ දෛනික ලොතරැයි දිනුම් ඇදීම් රූපවාහිනී විකාශනය කිරීම සහ ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීමට අදාළ කටයුතු මණ්ඩලය විසින්ම ඉටුනොකර එම කටයුතු සඳහා අතරමැදියකු ලෙස ප්‍රචාරණ සමාගම්වල සහාය ලබාගෙන ඒ සඳහා සියයට 15 ක සේවා ගාස්තුවක් ගෙවා තිබුණි. එවැනි අතරමැදි සහයකින් තොරව සෙවණ ලොතරැයියේ විකාශන කටයුතු මණ්ඩලයේ කාර්ය මණ්ඩලය විසින්ම සිදු කිරීමෙන් ඒ සඳහා වැය කිරීමට අපෙක්ෂිත මුදලින් 2019 සැප්තැම්බර් මස අවසාන වන විට රු.4,464,672 ක් ඉතිරි කර ගැනීමට හැකිවී තිබුණි. කෙසේ වුවද 2019 ඔක්තෝබර් මස 01 දින සිට එම ලොතරැයියේ ප්‍රචාරණ කටයුතුද, නව ප්‍රචාරණ ආයතනයක් වෙත පැවරීම හේතුවෙන් ඉහත සඳහන් පරිදි 2019 වර්ෂයට අදාළ අවසන් මාස තුන සඳහා ඉතිරි කර ගත හැකිව තිබූ රු.1,262,806 මුදල | සියළුම ලොතරැයි සඳහා රූපවාහිනී දිනුම් ඇදීම් හා නිල ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීමට එම ආයතන විසින්ම ප්‍රචාරණ නියෝජිත ආයතන වෙත 15% සේවා ගාස්තුවක් ගෙවනු ලබයි. මෙම ගෙවීම් සඳහා මණ්ඩලයේ මැදිහත් වීමක් සිදුනොවෙන අතර සෙවණ ලොතරැයිය සඳහා නියෝජිත ආයතනයක් නොතිබූ වකවානුවේ එම සේවා ගාස්තුව අඩු කොට එම ආයතන සඳහා ගෙවීම් කටයුතු කර ඇත. නිෂ්පාදන, විකාශන, හා ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීමේ කටයුතු මූලික කරගෙන සිදු කරන කාර්යයන් මණ්ඩලයට ඍජුවම කිරීමේ අපහසුතාවය සැලකිල්ලට ගෙන සෙවණ ලොතරැයිය සඳහා නියෝජිත ආයතනයක් බඳවා ගෙන ඇත. | ගිවිසුම් සංශෝධනය කර අදාළ අනාර්ථික වියදම් අඩුකර ගැනීමට කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| මණ්ඩලයට අහිමිවී තිබුණි. තවද අනෙකුත් ලොතරැයි 08 ක් වෙනුවෙන්ද එම කටයුතු ප්‍රචාරණ නියෝජිතායතන මඟින් ඉටු කිරීම වෙනුවෙන් රු.73,682,624 ක් අනාර්ථික ලෙස වැය කර තිබුණි. | | |
| (ඊ) 2016 වර්ෂයේ සිට ප්‍රසම්පාදනය ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව වෙබ් අඩවි දැන්වීම් පල කිරීම, මාධ්‍ය සම්බන්ධීකරණ ආයතනය (Group Media) විසින්ම සිදු කර තිබුණි. අදාළ පිරිවැය සෘජුවම මාධ්‍ය සැලසුම්කරණ ආයතනය විසින් ලබාගෙන එම පිරිවැයෙන් සියයට 11.5 ක මුදලක් අදාල වෙබ් අඩවි දැන්වීම් පලකල ආයතනය ද සියයට 3.5 ක් මාධ්‍ය සම්බන්ධීකරණ ආයතනයද විසින් ලබාගෙන තිබුණි. එමෙන්ම මණ්ඩලය දැනුවත් කිරීමෙන් තොරව වෙබ් අඩවි දැන්වීම මාධ්‍ය සම්බන්ධීකරණ ආයතනයේ වෙබ් අඩවිය තුල ප්‍රදර්ශනය වෙනුවෙන් රු.1,496,716 ක් අයකර තිබුණි. මණ්ඩලය විසින්ම මෙම වෙබ් දැන්වීම් නිර්මානය හා එම දැන්වීම අදාල ආයතනය වෙත යොමු කිරීම නිසා 2019 වර්ෂයේදී ඉතිරි කල වටිනාකම රු.2,722,353 ක් බව විගණනයේදී නිරීක්ෂණය විය. | අලෙවිකරණ ක්ෂේත්‍රයේ විවිධ දැන්වීම්කරණ උපක්‍රම කලානුරූපීව ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් සිදු කිරීම එහි නව ප්‍රවණතාවක් වන අතර ජාතික ලොතරැයි මණ්ඩලය ද එය අත්හදා බැලීම සිදු කර ඇත. එහෙත් මේ සම්බන්ධව ප්‍රමාණවත් අත්දැකීම් මණ්ඩලය සතුව නොතිබී ඇති අතර අදාළ කාරණා සම්බන්ධයෙන් තාක්ෂණික තොරතුරු ලබා ගැනීමේ අපහසුතාද පැවතී ඇත. එහිදී නීත්‍යානුකූල මාධ්‍ය සම්බන්ධීකරණ ආයතනය (Group M) අන්තර්ජාතික වශයෙන්ද අත්දැකීම් ඇති ආයතනයක් වන බැවින් ඔවුන්ගේ සේවය ලබා ගැනීම වඩාත් සුදුසු බව හැඟී ගොස් ඇත. ඒ අනුව ඔවුන්ගේ සේවය ලබා ගෙන ඇත. | මණ්ඩලය මඟින් ඉටුකල හැකි කාර්යභාරයන් සොයා බලා ඒ අනුව ප්‍රචාරන කටයුතු සිදු කිරීම. |
| (උ) මණ්ඩලයේ ලොතරැයි ප්‍රතිඵල පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමට හා ගුවන් විදුලි විකාශයට ප්‍රසම්පාදන කටයුතු සිදු නොකර ප්‍රචාරණ දැන්වීම් නියෝජිත ආයතන මඟින්ම එම කටයුතු සිදුකර ගෙන තිබුණි. ඒ සඳහා ගුවන් විදුලි හා පුවත්පත් ආයතන බිල්පත් වටිනාකමෙන් සියයට 15 ක මුදලක් එම ආයතන විසින් අතිරේකව අයකර තිබුණි. එලෙස 2017, 2018 හා 2019 වර්ෂ සඳහා ලොතරැයි 08 කට ගෙවා තිබූ නියෝජිත කොමිස් මුදල රු.31,683,786 ක් විය. එක් ලොතරැයිපතක පුවත්පත් හා ගුවන්විදුලි මාධ්‍ය විකාශයට අදාල දැන්වීම් භාරදීම මණ්ඩලය විසින්ම සිදුකර තිබුණි. එමඟින් 2017 ජූලි මස සිට 2019 ජූලි මාසය දක්වා වූ කාලයට ඉතිරි කරගත් නියෝජිත කොමිස් මුදල රු.2,271,588 ක් විය. | පුවත්පතේ ප්‍රතිඵල දැන්වීම් පුවත්පතේ පලවන අනෙකුත් දැන්වීම් වලින් වෙනස්ව කැපී පෙනෙන ආකාරයට පල කිරීම මඟින් වැඩි ආකර්ෂණයක් ලඟා කරගත හැකිය. අවම වියදමක් යටතේ මෙවැනි ආකාරයට පුවත්පත් ඉඩ වෙන්කරවා ගැනීම තුලින් වැඩි වාසි ලබාගත හැකිය. තව ද පුවත්පත් කියවන පාඨක පිරිස පාදක කර ගනිමින් වාර්තා ලබාගන්නා අතර අදාල පුවත්පතේ පලකරනු ලබන පිටුව අනුව රේටයන් පිළිබඳ අධ්‍යයනයක් කර දැන්වීම් පලකරනු ලබයි. | මණ්ඩලය මඟින්ම සිදුකල හැකි කාර්යභාරය සිදු කිරීමේ හැකියාව සොයාබලා කටයුතු කිරීම. |
| (ඌ) ලොතරැයි දිනුම් ප්‍රතිඵල පුවත්පත් දැන්වීමක ප්‍රදර්ශනය කල යුතු අවම වර්ග ප්‍රමාණය පිළිබඳ අවධානය යොමු නොකිරීමෙන් පුවත්පත් සඳහා විවිධ වර්ග ප්‍රමාණයන් වෙනුවෙන් විවිධ ගාස්තු රේටයන් යටතේ | ප්‍රතිඵල දැන්වීම, පුවත්පතේ පලවන අනෙකුත් දැන්වීම් වලින් වෙනස්ව කැපී පෙනෙන ආකාරයට පල කිරීම මඟින් වැඩි ආකර්ෂණයක් ලඟා කරගත හැකිය. අවම වියදමක් යටතේ මෙවැනි ආකාරයට | පාරිභෝගිකයාගේ අවශ්‍යතාවය පිළිබඳ අධ්‍යනයක් සිදුකර ඒ අනුව අවශ්‍ය වර්ග ප්‍රමාණයන් |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම් කර තිබුණි. මණ්ඩලය විසින් දිනපතා පලවන පුවත්පත් 04 ක පිටුවක හරි අඩක්ම ලබාගෙන ඒ වෙනුවෙන් 2017,2018 හා 2019 වර්ෂවලදී එසේ ගෙවා තිබූ මුදල පිළිවෙලින් රු.55,806,970 රු.67,052,788 ක් හා රු.42,686,370 ක් විය. එමෙන්ම සියලුම ලොතරැයි ප්‍රතිඵල දිනුම් අදිනු ලබන දිනට පසුදින දිවයින පුරා පිහිටි ලොතරැයි අලෙවි කුටි හා බෙදාහරින්නන් වෙත ප්‍රතිඵල සටහන ලබා දීම සිදු කරයි. එමෙන්ම වෙබ් අඩවිවල දැන්වීම් පල කිරීම තුල පුවත්පත් නිවේදනයක වර්ග ප්‍රමාණයන් කෙරෙහි විධිමත් අධ්‍යනයක් හා ඇගයීමක් සිදුකර නොතිබුණි. | පුවත්පත් ඉඩ වෙන්කරවා ගැනීම තුලින් වැඩි වාසි ලබාගත හැකිය. තව ද පුවත්පත් කියවන පාඨක පිරිස පාදක කර ගනිමින් වාර්තා ලබාගන්නා අතර අදාල පුවත්පතේ පලකරනු ලබන පිටුව අනුව රේටයන් පිළිබඳ අධ්‍යයනයක් කර දැන්වීම් පලකරනු ලබයි. | නිශ්චිතව තීරණය කිරීම සිදු කිරීම. |
| (එ) | ජාතික ලොතරැයි මණ්ඩලයේ දිනුම්වාර වලින් ඉවත්කරන ලද නොවිකුණු ලොතරැයිපත් ගබඩා කිරීමට මණ්ඩලය සතු වොක්ෂෝල් වීථියේ පිහිටි ඉඩමේ තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකර එහි ගබඩා කිරීමේ හැකියාව තිබියදී ඒ සඳහා මණ්ඩලය විසින් 2015 වර්ෂයේ සිට සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ වර්ග අඩි 3136 ක ගබඩා ඉඩකඩ ප්‍රමාණයක් ලබා ගෙන තිබුණි. එය පසුව වර්ග අඩි 6217 දක්වා වැඩිකරගෙන ඒ සඳහා වසරකට රු.12,572,495 ක් අනාර්ථිකව ගෙවා තිබුණි. එම ඉවත් කරනු ලබන ලොතරැයිපත් මාස 06 ඉක්මවන විට කැබලිවලට කපා ඒවා බැහැර කිරීමේ ක්‍රමවේදයන් නොතිබීම මෙම පිරිවැයට සෘජුව බලපාන බවද තවදුරටත් නිරීක්ෂණය විය. | 2015 වසරේ සිට ජාතික ලොතරැයි මණ්ඩලය මඟින් වාර කිහිපයකදී ගබඩා 7 ක් ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාව වෙතින් මාසික කුලී පදනම මත ලබා ගෙන ඇති අතර ඉන් වර්ග අඩි 3081 ක් බෙදාහැරීම් අංශයේ නොවිකුණූ ටිකට්පත් ගබඩා කර ඇත. විශාලත්වය වර්ග අඩි 784 ක් වූ ගබඩාවක් ප්‍රවාහන අංශය විසින් භාවිතා කරන අතර වාහනවලින් ඉවත් කරන ටයර්, වාහන අමතර කොටස් සහ ප්‍රවාහන අංශයේ පැරණි ලිපි ලේඛන මෙහි ගබඩා කර ඇත. විශාලත්වය වර්ග අඩි 784 බැගින්වූ ගබඩා දෙකක් ලිපිද්‍රව්‍ය ගබඩාව මඟින් භාවිතා කරන අතර එම ගබඩාව තුළ ප්‍රවර්ධන භාණ්ඩ, අබලි භාණ්ඩ සහ ලිපිද්‍රව්‍ය ගබඩා කර ඇත. මේ වනවිට ගබඩා 03 ක ගබඩා කර ඇති අලෙවියෙන් පසු ඉතිරිවූ ලොතරැයිපත් රැගෙන යාමේ ටෙන්ඩරය ලබා ගත් සමාගම එම ලොතරැයිපත් රැගෙන යාම ප්‍රතික්ෂේප කර ඇත. එම නිසා ලොතරැයිපත් නැෂනල් පේපර් කොම්පැනි ලිමිටඩ් (National Paper Company Limited) ආයතනය වෙත ලබාදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර එම අනුමැතිය ලබා ගැනීමෙන් පසු ගබඩා 03 නිදහස් කිරීමේ හැකියාව පවතී. | සුදුසු යන්ත්‍ර මිලදී ගැනීමෙන් මණ්ඩලය විසින්ම ඉටුකල හැකි කාර්යය සිදුකර අදාල ද්‍රව්‍ය බැහැර කිරීම සිදු කිරීම. |
| (ඒ) | පෙර වර්ෂයේදී ගෙවිය යුතු වියදමක් ලෙස නිවැරදි නොවන අයුරින් හඳුනාගෙන ගිණුම්ගත කරන ලද රු.10,962,695 ක ප්‍රචාරණ වියදමක් සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිවර්ත්‍යා කර වෙනත් ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ආදායම් බදු ලෙස රු.3,069,554 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි. | 2018 වර්ෂයේ ඇස්තමේන්තු ප්‍රචාරණ වියදම් වලට වඩා අඩුවෙන් වියදම් දැරීම නිසා ඉතිරි වූ මුදල වෙනත් ආදායම් වලට ලබාගැනීමට සිදුවී ඇත. මෙවැනි සිදුවීම් අවම කිරීමට මේ වන විට අවශ්‍ය පියවර ගෙන ඇත. | ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කළ යුතුවීම. |

**3.2** **හඳුනාගත් පාඩු**

......................

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ........................... | ................................................ | ................. |
| (අ) 2012 වර්ෂයේදී රු.825,000 ක් වැයකොට මිලදීගෙන තිබු අංක PS-2354 දරන වාහනය 2018 ජුනි 12 දින හදිසි අනතුරකට පත්වීම හේතුවෙන් එම වාහනය ගර්හිත කිරීමට සිදුවන බව රක්ෂකයා විසින් මණ්ඩලයට දැනුම් දී තිබුණු අතර ලබාදීමට එකඟ වු රක්ෂණ හිමිකම් රු.600,000 ක් විය. | PS - 2354 අංක දරණ වාහනය 2012 වසරේදී මිලදී ගත් වාහනයකි. මෙම රථය මේ වන විට වසර 08 ක කාලයක් මණ්ඩලීය රාජකාරි කටයුතු සඳහා යොදවා ඇති අතර එවකට මෙම වාහනය මිලදී ගෙන ඇත්තේ රු. 825,000 මුදලකටය. මෙම අනතුරට අදාල රක්ෂණ සමාගම වාහනය ගර්හිත කර රු.600,000 ක මුදලක් මණ්ඩලය වෙත ගෙවීමට එකඟ වී ඇත. පාවිච්චි කරන ලද මෙවැනි වාහනයක වෙළඳ පොළ වටිනාකම රු.400,000 – රු.500,000 පමණ වන බැවින් රක්ෂණ සාමාගම මඟින් ගර්හිත කර ලබා දීමට එකඟව ඇති මුදල ලබා ගන්නේ නම් එය මණ්ඩලයට වාසි දායක බැව් පෙනී ගොස් ඇත. නමුත් මේ පිළිබඳ තාක්ෂණිකව නිසි ඇගයීමක් සිදු කර තීරණයක් ගත යුතුව ඇති බැවින් ඒ සඳහා විධිමත් තාක්ෂණික කමිටුවක් පත් කර ඇති අතර ඔවුන්ගේ නිර්දේශ සහ අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් ලබා ගන්නා තෙක් අදාල අංශය විසින් වාහනයේ වන්දි මුදල් ලබා ගැනීමට හෝ අළුත්වැඩියාව සිදු කිරීමට කටයුතු කර නොමැත. තාක්ෂණික කමිටුවෙහි නිර්දේශ මත රජයට පාඩු නොවන සේ ඉදිරි කටයුතු කිරීමට අවශ්‍ය කිරීමට බලාපොරොත්තු වේ. | නොපමාව සුදුසු ක්‍රියාමාර්ගයන් සිදු කිරීම. |
| (ආ) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් සේවයට බඳවාගෙන මුදල් අමාත්‍යාංශයට නිදහස් කර ඇති සම්බන්ධීකරණ නිලධාරියකු වෙත රාජකාරි කටයුතු සඳහා ලබාදී තිබු අංක KV-0392 දරන වාහනය මණ්ඩලයට නොදන්වා 2018 අප්‍රේල් 12 දින එම නිලධාරියාගේ පෞද්ගලික ගමනක් සඳහා භාවිතා කිරීමේදී අනතුරකට පත්වී තිබුණු අතර එම වාහනය අළුත්වැඩියා කිරීම සඳහා රු.538,650 ක පිරිවැයක් දැරීමට සිදුව තිබුණි. ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි | KV – 0392 රථයේ අනතුරට අදාලව අලුත්වැඩියා කටයුතු සඳහා රු. 520,925 මුදලක් වැය වී ඇති අතර එම සම්පූර්ණ මුදල රක්ෂණ ආයතනය මඟින් පියවා ගෙන ඇත. | විධිමත් පරීක්ෂණයක් සිදු කර අදාල ක්‍රියාමාර්ග ගැනීම. |

| | | |
|---|---|---|
| (ඇ) 2018 ජනවාරි 21 දිනුම් අදින ලද 32 වන කලම්බු එයාර්පොර්ට් සුපර් ඩ්‍රෝ ලොතරැයියේ දිනුම් ඇදීමේදී අවලංගුකරන ලද රු.627,750 ක් වටිනා අස්ථානගත වූ ලොතරැයිපත් 135 ක් වූ අතර ඒ තුල පුද්ගලික ප්‍රචාරණ ආයතනය මඟින් ලොතරැයිපත් 66 ක්ද, මණ්ඩලයේ ප්‍රචාරණ කාර්ය අංශය මඟින් ලොතරැයිපත් 69 ක්ද අස්ථානගත කර තිබුණි. අදාල දිනුම් ඇදීමට වලංගු කල ලොතරැයිපත් 1027 ක් සඳහා ලැබිය යුතු අමෙරිකානු ඩොලර් 26,140 ක මුදලක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. එහි වෙළෙඳපොල වටිනාකම රු.5,607,420 ක් වී තිබුණි. | 32 වන කලම්බු එයාර්පොර්ට් ලොතරැයියේ ටිකට්පත් 15,000ක් මුද්‍රණය කර තිබුනද, කළමනාකාරිත්වය හා හිටපු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධිමත් කරුණු අධ්‍යනයකින් පසුව තව දුරටත් එම ලොතරැයිය පවත්වාගෙන යාමෙන් සිදුවිය හැකි පාඩුව අවම කර ගැනීම උදෙසා එම දිනුම් ඇදීම තෙක් අලෙවි කර තිබූ ලොතරැයිපත් ගණනින් දිනුම් ඇදීම සඳහා (5810) 2018/01/21 දින දිනුම් ඇදීම සිදු කර ඇත.<br>එම ලොතරැයි පතේ අලෙවි කටයුතු පුද්ගලික අලෙවි නියෝජිතයන් විසින්ද ආයතනයේ කාර්‍ය මණ්ඩලය විසින්ද සිදු කර ඇත. එහිදී දිනුම් ඇදීමට ටිකට්පත් සුදානම් කරන අතරතුර ටිකට්පත් 154 අස්ථාන ගතවී ඇති බවට කරුණු වාර්තා වී ඇති අතර එහිදී ඉහල කළමනාකාරීත්වයේ අවසරයෙන් හා එකඟත්වයෙන් පුවත්පත් දැන්වීමක් පලකර (සිංහල/දමිළ/ඉංග්‍රීසි) එම ටිකට් පත් (විකුණූ හෝ නොවිකුණූ) ඇත්නම් නැවත ජාතික ලොතරැයි මණ්ඩලයට භාරදෙන ලෙස දන්වා ඇති අතර එහිදී ටිකට් පත් 20ක් නැවත මණ්ඩලයට ලැබී ඇත. එම ටිකට් පත් නැවත දිනුම් ඇදීමට යොමු කර ඇත.<br>එසේම වැඩි දුරටත් එම පුවත්පත් දැන්වීමේ යම් අයකුට ටිකට්පත් වල අනාගතාවය සහතික කල නොහැකි නම් දිනුම් ඇදීමෙන් අවලංගු කරන බව ද වැඩි දුරටත් සඳහන් කර ඇත. එසේම දිනුම් ඇදීමට පෙර දින අදාල ටිකට්පත් 135 සඳහා පොලිස් පැමිණිල්ලක් සිදුකර දිනුම් ඇදීමෙන් ඉවත් කර ඇති අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ද අනුමැතියද ලබා ගෙන ඇත. එම නිසා මෙම ටිකට්පත් 135 වලංගු ටිකට් පත් ලෙස සැලකිය නොහැකි බව දන්වා සිටිමු.<br>එසේම පුද්ගලික අලෙවි ප්‍රචාරණ නියෝජිත ආයතනය විසින් විකිනීමට ලබා ගත් ටිකට් පත් 1027 වෙනුවෙන් අයවිය යුතු ඇ.ඩොලර් 26, 188.5 අසන්න වශයෙන් රු. 4,059, 217 අය කර ගැනීම සඳහා හිටපු අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කළමනාකාරීත්වයේ එකඟතාවය ඇතිව කොළඹ වංචා | මූලික පරීක්ෂණ සිදුකර වගකිව යුත්තක් හඳුනාගෙන අදාල ක්‍රියාමාර්ගයන් ගැනීම හා අලාභයන් අයකර ගැනීමට කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| | විමර්ශන අංශයට පැමිණිල්ලක් යොමු කර එය නිත්‍යානුකූලව එම ආයතනයෙන් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව දන්වා සිටිමු. දැනටමත් මණ්ඩලයේ සහ අදාල පාර්ශවයේ නිලධාරින් ගෙන්වා ප්‍රකාශ සටහන් කරගෙන ඇති අතර අදාල නීතිමය කටයුතු සිදු කරමින් පවතී. මෙහි වටිනාකම ගණනය කිරීමේදී සම්පූර්ණ ටිකට්පතේ වටිනාකම ඇ. ඩොලර් 30 නොව ඇ.ඩොලර් 25.5 ලෙස සලකා ගණනය කිරීම සිදුකල යුතුය. මන්දයත් සෑම පාර්ශවයකින්ම මණ්ඩලය අය කරනු ලබන්නේ අදාල කොමිස් මුදල (15%) අඩුකර ගැනීමෙනි. | |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

.........................................

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉකුත් වර්ෂවලදී වැඩිපුර ගෙවනලද රු.7,392,287 ක සේවක පාරිතෝෂික මුදල මණ්ඩලයට ආපසු අයකරගන්නා ලෙස පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2013 මාර්තු 21 දින නියෝග කර තිබුණද එම මුදල අය කර ගැනීමට හෝ ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට හෝ කටයුතු කර නොතිබුණි. වැඩිපුර ගෙවා ඇති පාරිතෝෂික මුදල මණ්ඩලයට ප්‍රතිපූර්ණය කරන ලෙස අදාළ විශ්‍රාමික නිලධාරීන්ට ලිඛිතව දැන්වීම පමණක් මණ්ඩලය විසින් සිදු කර තිබුණි. | විශ්‍රාමික නිලධාරීන් හට ගෙවන ලද රු.7,392,287/- ක් වන පාරිතෝෂික මුදල් අයකර ගැනීම සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගත් අතර විශ්‍රාමික නිලධාරීන් හට පාරිතෝෂික මුදල් දීම ත්‍යාගයක් ලබාදීමක් ලෙස සැලකෙන බැවින් ඔවුන් ප්‍රතිපූරණය නොකරන්නේනම් එකී මුදල් අයකර ගැනීමට හැකියාවක් නොමැති බවට එවකට පත්ව සිටි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇත. | පොදු ව්‍යාපාර කාරක සභාවේ එකඟතාවය ලබා ගත යුතු වීම. |
| (ආ) 2014 නොවැම්බර් 04 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේදී ලබාදී තිබූ නියෝගය අනුව, මණ්ඩලය සතු වොක්ෂෝල් වීදියේ පිහිටි පර්චස් 112 ක ඉඩමේ නව ගොඩනැගිල්ලක් ඉදිකළ යුතු විය. එහෙත් 2016 වර්ෂය අවසාන වන විටත් ගොඩනැගිල්ලේ සැලසුම් කටයුතු සඳහා ගෘහ නිර්මාණ ශිල්පියෙකු තෝරා ගැනීම පමණක් සිදුකර තිබුණි. මෙම ඉදිකිරීම 2020 ජුනි 01 තෙක් ආරම්භ කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ කාර්යාල කටයුතු පවත්වාගෙන යාමට ලබාගෙන තිබුණ ගොඩනැගිල්ල වෙනුවෙන් මාසිකව කුලී ලෙස රු.101,532,720 ක් ද ගොඩනැගිල්ලේ කාමර වෙන්කිරීම හා නවීකරණය සඳහා රු.3,175,057 ක් වැට් බදු සහිතව ගෙවා තිබුණි. | නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පත් කර ගෙන ඇති උපදේශන සේවා ආයතනය විසින් එකඟ වූ පරිදි ලංසු ලේඛන පිළියෙළ කිරීමේ කාර්යය දක්වා වූ වැඩ කොටස් අවසන් කර නව ඇස්තමේන්තුව සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් 2018.03.21 වන දින යොමු කර ඇත. මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් 2018.04.03 දිනැති ලිපිය මඟින් දැනට රජයේ පවතින ප්‍රතිපත්ති අනුව නව ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා අවසර ලබා දිය නොහැකි බව මණ්ඩලය වෙත දන්වා එවා ඇති හෙයින් මාසික කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබා ගෙන ආයතනයේ කටයුතු පවත්වාගෙන යනු ලැබේ. | අදාල ගොඩනැගිල්ල ඉදිකිරීම සහ පොදු ව්‍යාපාර කාරක සභාවේ එකගතාවය ලබා ගත යුතු වීම. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

.....................................

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය ............................ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ............................................... | නිර්දේශය ................. |
|---|---|---|
| (අ) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී ජංගම ප්‍රචාරණ රථ 21 ක් සඳහා රියදුරු හා ප්‍රචාරක නිලධාරියකු බැගින් යොදවා රු.119,386,000 ක් වටිනා ලොතරැයිපත් අලෙවි කර තිබුණි. එම අලෙවියන් මත සියයට 17.5 ක් වූ විකුණුම් කොමිස් මුදල රු.20,892,550 ක වටිනාකම පිළිබඳ කිසිදු ලේඛනගත සාක්ෂියක් ලබා නොගෙන එම සම්පූර්ණ මුදල අදාල කාර්යයේ නියුතු නිලධාරීන් වෙත ලබා ගැනීමට ඉඩ දී තිබුණි. එම අංශයේ කාර්යභාරය, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් ස්ථාපිත වී නොතිබූ අතර අදාළ කාර්යයට යොදා ගනු ලබන වාහන වෙනුවෙන් යොදන ලද ඉන්ධන විස්තර ධාවන සටහන්වලට ඇතුලත් කර නොතිබුණි. | ජංගම ප්‍රචාරක අංශය අලෙවි ප්‍රවර්ධන සහ ප්‍රචාරණය වෙනුවෙන් ක්‍රියාත්මක වන අංශයකි. එම අංශයේ කාර්යභාරය සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු යෙදීමට සැලසුම් කර ඇති අතර ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක්ද ඉදිරි අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමට යොමුකර ඇත. | නිවැරදි ලේඛන පැවැත්වීම මත අදාල කටයුතු සිදු කිරීම. |
| (ආ) කාර්ය මණ්ඩලය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන විවිධ අරමුදල් 04 ක් විගණනය කිරීම සඳහා පෞද්ගලික විගණකවරුන් පත්කර තිබූ අතර එම විගණකවරුන් සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.180,000 ක් ද පසුගිය වර්ෂයන් වෙනුවෙන් රු.354,000 ක් ද විගණන ගාස්තු ලෙස අදාල අරමුදල්වලින් නොගෙවා මණ්ඩලයේ අරමුදල් භාවිත කර ගෙවා තිබුණි. මෙම ගෙවීම සඳහා මණ්ඩලය විසින් මුදල් අමාත්‍යාංශයේ අනුමැතියක්ද ලබාගෙන නොතිබුණි. | මණ්ඩලය අරමුදල් විගණනය කරන පෞද්ගලික විගණන ආයතනය දිගුකාලයක සිට කටයුතු කරන හෙයින් ඔවුන් මගින්ම සේවය ලබා ගෙන ඇත.<br>• සේවක අර්ථසාධක අරමුදලේ ව්‍යවස්ථාවට අනුව එකී අරමුදලේ සියළුම වියදම් මණ්ඩලය විසින් දරනු ලැබේ .<br>• වෛද්‍ය රක්ෂණ අරමුදලට , අරමුදල් ප්‍රේෂණය වන්නේ මණ්ඩලය මගින් සහ අරමුදලේ මුදල් ඉතිරියක් වුවහොත් එය නැවත මණ්ඩලයට පියවනු ලැබේ. එහෙයින් මණ්ඩලය විසින් එම ගෙවීම් කරනු ලැබේ.<br>• සේවක සුභසාධක හා සකසුරුවම් අරමුදල සම්බන්ධව විගණන ගාස්තු ගෙවීමේදී එවකට පැවති ඉහළ කළමණාකරණය වෙත ඉදිරිපත් කර ලබාගත් අනුමැතිය මත පෞද්ගලික විගණන ආයතනයකින් විගණන කටයුතු සිදු කර ගනු ලබයි. වාර්ෂික ආදායම් බදු ගණනය කිරීම සිදු කළ යුතු හෙයින්ද එකී ආයතනයෙන් විගණන සේවාව දීර්ඝ කාලීනව ලබා ගෙන ඇත .<br>එමෙන්ම විගණන ගාස්තු ගෙවීමේදී, එම ගෙවීම් සභාපතිතුමාගේ අනුමැතිය මත අදාළ ආයතනය වෙත ගෙවීම් සිදු කර ඇත . | මුදල් අමාත්‍යාංශ අනුමැතිය මත කටයුතු සිදු කිරීම. |

| | | |
|---|---|---|
| (ඇ)මණ්ඩලයේ ලියාපදිංචි අලෙවි නියෝජිතයින්ගෙන් ඇප බැඳුම්කර ලබා ගැනීමේ අවශ්‍යතාවය අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අවධාරණය කර තිබියදීත් ඒ සඳහා ක්‍රියානොකර රු.8,290,055 ක අමතර පිරිවැයක් දරා 2016 ජූලි සිට 2017 ජූලි දක්වා කාලයට ණයවර රක්ෂණාවරණයක් ලබාගෙන තිබුණි. එහෙත් එමගින් 2016 හා 2017 වර්ෂ වෙනුවෙන් නොගෙවා ඇති ණය ශේෂය වන රු.23,365,438 ක මුදල අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය. | රක්‍ෂණාවරණය වෙතින් නොපියවූ ණය ශේෂයන්ට අදාල ප්‍රතිලාභ ඉල්ලුම් කළ ද, එම ඉල්ලීම් නියමිත කාල පරිච්ඡේදය ඉක්මවා සිදු කිරීම නිසාවෙන් ජාතික රක්‍ෂණ භාර අරමුදල් මණ්ඩලයෙන් ලබා ගැනීමට නොහැකි වුව ද, 2020 වර්ෂය ආරම්භය වන විට විෂයගත සියලුම ණය ශේෂයන් පියවා අවසන් කර ඇත. එමෙන්ම එලෙස නොපියවා ශේෂව ඇති ණයගැතියන් සම්බන්ධයෙන් නීති කටයුතු ආරම්භ කර ඇත. | අදාල අලාභයන් අයකර නොගැනීමට හේතු විමර්ශනය සිදුකර ඒ අනුව කටයුතු කිරීම. |
| (ඈ) මණ්ඩලයේ අරමුදල්වලින් ලබාදී තිබූ දේපල ණයවලට අදාළ ඔප්පු 114 ක් වෙනුවෙන් අවලංගු කළ නොහැකි අටෝර්නි බලය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ජාතික ලොතරැයි මණ්ඩලයේ අරමුදල් වලින් ලබා දී ඇති නිවාස ණය වලට අදාළ දේපල ජාතික ලොතරැයි මණ්ඩලය වෙත උගස් කර ඇත. එකී උගස්කර (Mortgage Bonds) 114 නීතඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් නිසි ලෙස ලියා සහතික කර අදාළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල වල ලියාපදිංචි කර ඇත. ණය ලබාගත් පුද්ගලයා ගෙවීම පැහැර හැරියහොත් උකස් නඩුවක් (Mortgage Bond Case) අධිකරණයේ ගොනුකර ණය අයකරගැනීමේ හැකියාව ඇත. එබැවින් අවලංගු කල නොහැකි ඇටෝනි බලය පවරා ගැනීමක් සිදුකිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගී. | අවලංගු කළ නොහැකි ඇටෝර්නි බලය පවරා ගැනීමට කටයුතු කිරීම. |
| (ඉ) සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් මුද්‍රණය කරවා ගනු ලබන ලොතරැයිපත්වල අවශ්‍යතාවය නිසි පරිදි පුරෝකථනය නොකර මුද්‍රණ ඇනවුම් ලබාදීම හේතුවෙන් වර්ෂය තුලදී මුද්‍රිත ලොතරැයිපත්වලින් සියයට 9 පමණ ප්‍රමාණයක් නොවිකිණී ඉතිරිව පැවතුණි. | සමාලෝචිත වර්ෂය සැලකීමේදී ජාතික ලොතරැයි මණ්ඩලය විසින් දෛනික දිනුම් අදින ලොතරැයිපත් මිලියන 1163ක් මුද්‍රණය කොට ඇති අතර ඉන් මිලියන 95ක ප්‍රමාණයේ අලෙවි නොවූ ලොතරැයිපත් ලෙස හඳුනාගත හැක. එය ප්‍රතිශතයක් ලෙස 8.19% කි. දෛනික දිනුම්වාරයන්හි දිස්ත්‍රික් අලෙවි නියෝජිත අලෙවිය හා නැවත බාරදෙන ලොතරැයි පිලිබඳ නිරන්තර අධීක්ෂණය සහ දිස්ත්‍රික් අලෙවි නියෝජිත ඇණවුම් කළමණාකරනය කිරීම මගින් 2020 වර්ෂයේ මුල් කාල සීමාව වනවිට මෙම අගය 5% ප්‍රමාණයට අඩුවෙන් පවත්වා ගැනීමට කටයුතු කර ඇත. | නිවැරදි හේතු දැක්වීම හඳුනාගෙන ඇතත් අදාල පුරෝකථනයන් මත මුද්‍රණ ඇනවුම් ලබාදීම සිදු කිරීමට කටයුතු කිරීම. |
| (ඊ) 2017 වර්ෂයේ දී ප්‍රසම්පාදන කටයුතු සිදුකළ රු.6,110,000 ක් වටිනා මහජන ඇමතුම් යන්ත්‍ර 650 කින් රු.1,588,600 ක් වටිනා මහජන ඇමතුම් යන්ත්‍ර 169 ක් 2020 ජූනි 12 දින වන විටත් නොබෙදා ගබඩාවේ පැවතිණි. එම | මහජන ඇමතුම් පද්ධති එම අවශ්‍යතාවයන් ක්ෂේත්‍ර නිලධාරීන් මගින් හඳුනාගැනීම සිදු කර ඇත. අදාල අලෙවි නියෝජිතයන්ට ලබා දීම සඳහා මිලදී ගැනීමට සැලසුම් කර ඇති අතර ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පවතින | තත්‍ය අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන මිලදී ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| භාණ්ඩවල ගුණාත්මකභාවය, කල්පැවැත්ම හා නියෝජිතයන්ට ඒවායේ අවශ්‍යතාවය යනාදිය පිළිබඳ විධිමත් අධ්‍යනයක් ද කර නොමැති අතර ඒවායේ වගකීම් කාලයද ඉක්ම ගොස් ඇති බවත් නිරීක්ෂණය වීය. | ප්‍රායෝගික දුෂ්කරතාවයන් හේතුවෙන් නියමිත කාලයන් හිදී එම භාණ්ඩ ලබා ගැනීමට නොහැකි වී ඇත. නමුත්, අදාළ භාණ්ඩ ලැබීමෙන් පසුව හඳුනාගන්නා ලද අවශ්‍යතාවයන් සඳහා මෙම මහජන ඇමතුම් පද්ධති ලබා දීම සිදු කර ඇති අතර මේ වන විට එයින් මහජන ඇමතුම් පද්ධති 169ක් ඇත. අවශ්‍යතාවයන්ට සුදුසු පරිදි ලබා දීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | |
| (ඍ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වත්කම් යටතේ දක්වා ඇති විවිධ තැන්පතු අතර රු .380,000 ක වටිනාකමකින් යුත් තැන්පතු සඳහා නියමිත සේවාවක් ලබාගෙන අවසන් වී ඇතත් ඒවා නිරවුල් කිරීම සිදුකර නොතිබුණි. | 2004 වර්ෂයේ දී ගෙවීම් කල රු. 100,000ක තැන්පතු මුදල අය කර ගැනීමේ හැකියාවක් නොමැත. ගිණුම් වලින් ඉවත් කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට මුදල් අමාත්‍යාංශය වෙත 2018.08.03 හා 2019.08.27 යන දිනවලදී මුදල් අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇති බැවින් අනුමැතිය ලැබූ පසු ගිණුම් වලින් ඉවත් කිරීමට බලාපොරොත්තු වේ.<br>තවද මහත්මා වැඩසටහන පැවති හෝටලය සඳහා සිදුකරන ලද අවසාන ගෙවීමේදී රු.200,000ක අත්තිකාරම් මුදල අඩුකර ගෙන ගෙවා ඇති අතර ගිණුම්ගත කිරීමේදී ඇතිවූ දෝෂයක් හේතුවෙන් මෙලෙස ශේෂයක් පෙන්නුම් කරන අතර මෙය නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත. ගුවන්තොටුපලට ගෙවන ලද රු. 20,000ක මුදලද නැවත අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | නොපමාව අවශ්‍ය නිරවුල් කිරීම් සිදු කිරීම. |
| (ඎ) මණ්ඩලයට නියෝජිතයින්ගේ විද්‍යුත් තැපැල මගින් දැනුම් දෙනු ලබන නොවිකුණූ ලොතරැයිපත් සම්බන්ධ ඊමේල් පනිවිඩය පවත්නා පරිගණක මෘදුකාංගය තුලින් සාවද්‍ය ලෙස දෙවරක් බිල්පතක මුද්‍රණය වී තිබුණු අවස්ථා විය. එම දෝෂයන් නිවැරදි කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | විද්‍යුත් තැපෑලෙන් ලැබෙන නොවිකුණූ ලොතරැයිපත් "Process" කිරීමෙන් අනතුරුව බැරපත් නිකුත් කිරීම සඳහා පෙන්නුම් කරනු ලබන අතර, එක් අයකු විසින් අදාල නියෝජිතයාගේ ලොතරැයිපත් වල කාණ්ඩ අංක තෝරා බැරපතක් නිකුත් කිරීමෙන් පසු එය එම මෙනුවෙහි නොපෙන්වයි. නැවත වරක් පද්ධතියට ඇතුලත් කිරීමට නොහැකිවන ලෙස අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් දැනට පවතින පද්ධතිය තුල පවතින අතර එය ස්වයංක්‍රියව දත්ත ක්‍රියාකරුට දැනුම් දීමේ පණිවිඩයක් පද්ධතිය මගින් එම අවස්ථාවේදී ලැබේ. පරිගණක ජාලකරණ පද්ධතියෙහි අධික තදබදයක් පවතින වේලාවන්හිදී අදාළ බැරපත නිකුත් කිරීම සඳහා ලොතරැයිපත් වල කාණ්ඩ අංක තෝරා බිල්පත දත්ත ගබඩාවේ “save” කරන අවස්ථාවේදී එය save (ගබඩා) වීමට පෙර තවත් දත්ත ක්‍රියාකරුවෙක් එය | පවත්නා පරිගණක මෘදුකාංග යාවත්කාලීන කිරීම. |

| | | |
|---|---|---|
| | තෝරාගතහොත් පරිගණක ජාලකරණ පද්ධතියෙහි ඇති තදබදය නිසා දත්ත ගබඩාවේ ස්වයංක්‍රියව සිදුවන අගුලු වැටීම හේතුවෙන් (Database Table Lock) මෙම පණිවිඩය දත්ත ක්‍රියාකරුට දැන ගැනීමට නොහැකි වන අවස්ථාවන් පවතී. පවතින පද්ධතිය තුල මෙම දෝෂයට පිළියමක් ලබාදිය නොහැකි අතර (ලොතරැයි කළමනාකරණ පද්ධතියෙහි source code නොමැතිවීම නිසා) නව මෘදුකාංගයක් නිර්මාණය කිරීමේදී මෙම Error handling සිදුකර නිර්මාණය කිරීමට මේ වන විටත් මූලික කටයුතු සකස් කොට ඇත. | |
| (එ)ජාතික ලොතරැයි මණ්ඩලය අලෙවි නියෝජිතයින් බඳවාගැනීම වෙනුවෙන් බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර ඒ අනුව බඳවා ගැනීමට මෙන්ම ඔවුන්ගේ සුදුසුකම් පරීක්ෂාව, අධීක්ෂණය, ලියාපදිංචිය, මූල්‍ය හැකියාවක් තීරණය කිරීම හා ඉවත් කිරීම් යනාදිය තීරණය කර නොතිබුණි. දැනට පවතින අලෙවි නියෝජිතයින්ගේ පුරප්පාඩු සංඛ්‍යාව ප්‍රසිද්ධ කර බඳවා ගැනීමේ කටයුතු විනිවිදභාවයෙන් සිදු කිරීම මෙන්ම අක්‍රීය තත්වයේ සිටින නියෝජිතයින් පිළිබඳ විධිමත් පරීක්ෂන පවත්වා මණ්ඩලයට අයවිය යුතු මුදල් අයකර ගෙන නොතිබුණි. එම නියෝජිතභාවය අහෝසිකල නියෝජිතයින් පිළිබඳ දැන්වීම් මඟින් ජනතාව දැනුවත් කර නොතිබුණි. 2020 ජුනි 20 දින වන විට අක්‍රීය නියෝජිතයින් 04 කගේ ගිණුම් හරහා වෙනත් සක්‍රීය අලෙවි නියෝජිතයින් තම කටයුතු සිදුකරන බවද නිරීක්ෂණය විය. | නියෝජිත ධූරයක් ඉල්ලීම මණ්ඩලයේ සභාපතිතුමාගේ අනුමැතිය මත අදාල දිස්ත්‍රික්කයේ කළාප කළමණාකරුගේ ලිඛිත නිර්දේශයක් ගනු ලැබේ. නියෝජිත කළමණාකරණ නිලධාරි, සහකාර සාමාන්‍යාධිකාරි (නියෝජිත කළමණාකරණ), සහකාර සාමාන්‍යාධිකාරි (අලෙවි), විසින් මෙම ලිපි ගොනු පරීක්ෂා කර බලා නිර්දේශ කල පසු අතිරේක සාමාන්‍යාධිකාරි මඟින් සාමාන්‍යාධිකාරි මඟින් සභාපතිතුමා වෙත නැවතත් ඉදිරිපත් කර ගිවිසුමකට ඇතුලත්ව අලෙවි නියෝජිත අංකයක් ලබා දෙනු ලැබේ. සෑම අලෙවි නියෝජිතයෙකු සඳහාම දිනකට අලෙවි කල යුතු අලෙවි ඉලක්කයක් අලෙවි අංශය මඟින් ලබාදෙයි. නව අලෙවි නියෝජිතධූර ලබා දීමෙන් පසු එහි ප්‍රගතිය අලෙවි අංශය මඟින් නිරීක්ෂණය කරන අතර අලෙවි කටයුතු දුර්වල අලෙවි නියෝජිතයන් සඳහා අලෙවි නියෝජිතධූරය අක්‍රීය කිරීම වැනි ක්‍රියාමාර්ගද ගනු ලැබේ. | බඳවාගැනීම් පරිපාටියක් සකස් කර බඳවා ගැනීම් සිදු කිරීමත් අක්‍රිය නියෝජිතයින් නොපමාව ඉවත් කිරීමත් සිදු කිරීම. |
| (ඒ) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් විෂය භාර අමාත්‍යවරයාගේ හෝ මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වයකින් නොමැතිව ලොතරැයි වෙළඳපල පිළිබඳ අධ්‍යානයකින් තොරව 2016 වර්ෂයේදී ආරම්භකල ඩොලර් ෆෝචූන් ලොතරැයිය 2020 ජුනි 30 දිනවනවිටත් දිනුම් ඇදීම සිදු කර නොතිබුණි. එහි මුද්‍රිත ලොතරැයිපත් සංඛ්‍යාව 30000 ක් වූ අතර 2019 දෙසැම්බර් 09 දිනට අලෙවිකර තිබූ ලොතරැයිපත් සංඛ්‍යාව 6027 ක් විය. නැවත එදිනට ගබඩාවේ හා අතැති ටිකට්පත් සංඛ්‍යාව 21942 ක් විය. ලොතරැයිපත් 2031 ක් විවිධ පාර්ශවයන්ට නිකුත් කර තිබුණද ඔවුන්ගේ තොරතුරු මණ්ඩලයට ලබාදී නොතිබුණි. | ඩොලර් ෆෝචූන් ලොතරැයියේ ආදායම විභජනය කිරීමේදී ත්‍යාග මුදල ඇමරිකානු ඩොලර් 100,000 මුදල වෙන් කර ඇති අතර කොමිස් මුදල විකුණුම් මුදලින් 15% කි. අරමුදල් ලෙස දිනුම් වාරය අවසන් වී ලාභ අලාභ ගිණුමක් සකසා එයින් ලාභයක් පවතී නම් එකී මුදල ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබේ.<br>එමෙන්ම දැනට කිසිදු බාහිර පාර්ශවයක් සතුව ටිකට්පත් නොමැති අතර මණ්ඩලයේ සේවකයින්, කලාප කළමනාකරුවන් හා අලෙවි ප්‍රවර්ධන නිලධාරීන් සතුව ටිකට්පත් ඇති අතර, තවම දිනුම් ඇදීමේ දිනයක් ප්‍රකාශයට පත්කර නොමැති නිසා ඍජුව එම | පනතේ විධිවිධාන මෙන්ම භාණ්ඩාගාර උපදේස් පරිදි කටයුතු කිරීම. |

ටිකට්පත් විකිණීමට අවස්ථාව ලබා දී ඇත. එසේම ඔවුන් සතුව ඇති ටිකට්පත් ප්‍රමාණය ආසන්න වශයෙන් ටිකට්පත් 982ක් පමණ වේ. ලොතරැයි දිනුම් ඇදීමේ දිනයක් ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව එම ටිකට්පත් ලබා ගැනීම හා අලෙවි කල ටිකට්පත් දිනුම් ඇදීම සඳහා යොමු කිරීම සිදුකරනු ලබයි.

(ඖ) ජාතික ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි දිනුම්වාර රාජකාරි සඳහා කාර්ය මණ්ඩල අනුයුක්ත කිරීමේදී 2019 මාර්තු 29 දිනැති ජා.ලො.ම/චක්‍රලේඛ/2019/02 චක්‍රලේඛයේ උපදෙස් අනුව ක්‍රියාකල යුතු බව දක්වා තිබුණි. එහිදි පරිවාස කාලයට අයත් නිලධාරීන්ට නියමිත සීමාවන් ඉක්මවා අනුයුක්ත කිරීම් සිදු කිරීම හේතුවෙන් සහකාර සාමාන්‍යාධිකාරිවරු දෙදෙනෙකු හා එක් නිලධාරියෙකු විසින් දින 165 ක් සඳහා ලොතරැයි දීමනා ලෙස රු.1,452,000 ක් ලබාගෙන තිබුණි. පුරප්පාඩු තනතුරක් පිරවීමෙන් පසුවද එම තනතුර පුරප්පාඩු ලෙස සලකා දින 19 ක් වෙනුවෙන් නැවත නිලධාරීයෙකුට රු.167,200 ක් ගෙවීම් කර තිබුණි.

සහකාර සාමාන්‍යාධිකාරී (නියෝජිත කළමණාකරණ) තනතුරේ වැඩ බැලීම සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) විසින් සිදු කරන ලද අතර එම පුරප්පාඩුව 2019.09.02 දින පුරවා ඇත. එසේ වුවද සැප්තැම්බර් මස කාර්ය චක්‍රයට සහකාර සාමාන්‍යාධිකාරී (නියෝජිත කළමණාකරණ) ඇතුලත් කර නැති අතර සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) විසින් දින 12ක් දිනුම් ඇදීම් රාජකාරී සඳහා සහභාගී වී ඇත. එම කාල සීමාව තුළ සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) කාර්ය චක්‍රයන්ට අනුව සේවයේ යොදවා ඇති දින ගණන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| මාසය | ගෙවීම් කළ දින ගණන | වැඩිපුර ගෙවීම් කරන ලද දින ගණන |
|---|---|---|
| සැප්තැම්බර් | 12 | 4 |
| ඔක්තෝබර් | 12 | 4 |
| නොවැම්බර් | 12 | 4 |
| දෙසැම්බර් | 11 | 3 |
| | | 15 |

ඒ අනුව දෙසැම්බර් මස වැඩිපුර දින 4ක් සඳහා ගෙවීම් කර ඇති බැව් දන්වා තිබුණද දෙසැම්බර් මස වැඩි පුර ගෙවීම් කර ඇත්තේ දින 3ක් පමණි. එසේම ජනවාරි සහ පෙබරවාරි යන මාසයන්හි කාර්ය චක්‍රයන්ට අනුව දින 9 බැගින් ලබාදී තිබුණද ගෙවීම් කර ඇත්තේ දින 8 බැගින් වේ. සේවා අවශ්‍යතාවයන් මත කාර්ය චක්‍රයන් හරහා සේවයේ යොදවා ආයතනය විසින් ඔහුගේ සේවය ලබා ගෙන ඇති අතර මේවන විට ඔහු වෙත ගෙවීම් කරනුයේ දින 08ක් වන පරිදි පමණි.

භාණ්ඩාගාර චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කිරීම.

(ක) ජාතික ලොතරැයි මණ්ඩලයේ 2015 සිට 2019 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව කටයුතු කල අධ්‍යක්ෂක මණ්ඩල හා නිලධාරීන් වෙත ලබාදුන් රු.922,000 ක් වටිනා ඉන්වෙන්ට්‍රිගත භාණ්ඩ

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත හිටපු සභාපති, ක්‍රියාකාරී අධ්‍යක්ෂ සහ අතිරේක සාමාන්‍යාධිකාරි වෙත ලබා දී තිබූ භාණ්ඩ සඳහා ක්ෂය අඩු කිරීමෙන් පසු වටිනාකම අය

ඉන්වෙන්ටරි ගත භාණ්ඩ නැවත භාර ගැනීමට හෝ අදාල මුදල්

| | | |
|---|---|---|
| (ජංගම දුරකථන, I Pad, Mack Book) 2020 ජුනි 09 දින වන විටත් නැවත භාරදීමට කටයුතු කර නොතිබූ අතර ඔවුන්ට ගෙවිය යුතු රු.582,356 ක මුදලක්ද ආයතනයේ රඳවාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් භාණ්ඩ භාරදෙන ලෙස 2020 ජනවාරි 16 දිනදි වූ ලිපියක් අදාල පාර්ශවයන් වෙත යොමු කර තිබුණි. | කර ගැනීමට කටයුතු කරමින් පවතී. | අයකර ගැනීමට කටයුතු කිරීම. |

**3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙන**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉඩමේ අයිතිය නීත්‍යානුකූලව සම්පූර්ණයෙන්ම පැවරී නොතිබියදී මණ්ඩලය විසින් එහි නිලධාරියෙකුට රු.624,780 ක නිවාස ණය මුදලක් ලබාදී තිබූ අතර එම නිලධාරියා 2017 ජුනි 17 දින සේවය හැරගොස් තිබුණි. නිවස ඉදිකිරීමට යෝජිත ඉඩම එම ඉඩමේ හිමිකරු විසින් ජීවිත භුක්තිය තබාගෙන නිලධාරියාට පවරා දී තිබුණි. ඉඩමේ හිමිකරු විසින් එම ඉඩමේ භුක්තිය ඉවත් කරගෙන ඉඩමේ අයිතිය නිලධාරියාට පවරනු බවට වූ ලිඛිත ප්‍රකාශයක් පෞද්ගලික නීතිඥ සමාගමක් මාර්ගයෙන් ඉදිරිපත් කර තිබුණි. එහෙත් පසුව අදාළ දේපලේ භුක්තිය නැවත ඉල්ලා එම පාර්ශවය විසින් උසාවියේ නඩුවක් පවරා තිබූ අතර එහි පාර්ශවකරුවෙකු ලෙස මණ්ඩලය නම්කර තිබුණි. මණ්ඩලය තුල වෘත්තිය සුදුසුකම් ලත් නීතිඥයෙකු සිටියදී මෙම නඩුවේ නඩුවාර 13 ක් සඳහා මණ්ඩලය විසින් රු.313,825 ක් නීතිඥ ගාස්තු ලෙස ගෙවා බාහිර නීතිඥයන් යොදවා ගෙන තිබුණි. | ගම්පහ දිසා අධිකරණයේ පවරා තිබූ අංක 2075/L දරන නඩුවේ ජාතික ලොතරැයි මණ්ඩලය පාර්ශවකරුවෙකු කර තිබුනේ එම දේපල එකී නිලධාරියා විසින් ජාතික ලොතරැයි මණ්ඩලයට උකස් කර තිබූ හෙයිනි. එකී නඩුව අවසන් වූ අතර එකී නිලධාරියාගේ වාසියට එම නඩුව තීරණය විය. අදාළ දේපලෙහි අයිතිය නීත්‍යානුකූලව එම නිලධාරියාට හිමිවන බවට තීන්දු විය. | නොපමාව අදාල අලාභයන් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) 2016 වර්ෂයේදී නියෝජිතයන් වෙත බිල්පත් නිකුත්කර විකුණුම් ආදායමට බැර කර තිබූ රු.2,859,585 ක් වටිනා ක්ෂණික ලොතරැයිපත් සමාලෝචිත වර්ෂයේදී ආපසු එවා තිබුණි. එහෙත් 2016 වර්ෂයේදී සමස්ත විකුණුම් පදනම් කරගෙන කාර්ය මණ්ඩලයට සහ නියෝජිතයන්ට රු.35,813,250 ක දිරි දීමනා එම වර්ෂයේදීම ගෙවා තිබූ අතර එහිදී මෙම වටිනාකම් ගැලපීම් කිරීමටද කටයුතු කර නොතිබුණි. | ලොතරැයිපත් වලට අදාළ ණය මුදල් ගෙවීම ප්‍රමාද කල හා නිසි පරිදි නොගෙවන ලද දිස්ත්‍රික් නියෝජිතයින් පසුව තිබූ ලොතරැයිපත් වලින් කොටසක් නැවත ප්‍රධාන කාර්යාලයට ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. පරිගණක පද්ධතියට අනුව ක්ෂණික ලොතරැයිපත් ආපසු එවුම් ලෙස ගිණුම් ගත කිරීමේ හැකියාවක් නොතිබූ බැවින් ඒවා සුදුසු පරිදි සටහන් කරගෙන වෙනත් දිස්ත්‍රික් නියෝජිතයින් සහ ආයතනයේ ජංගම ප්‍රචාරක අංශය හරහා අලෙවි කිරීමට | ගෙවා ඇති දිරිදීමනා නැවත ගැලපීම් සිදු කිරීම. |

| | | |
|---|---|---|
| | කටයුතු කරමින් පවතින අතර එම තත්ත්වයන් හේතුවෙන් මේ සම්බන්ධයෙන් නැවත ගැලපීම් සිදුනොකරන ලදී. | |
| (ඇ) 2018 මාර්තු 07 දින මහනුවර දිස්ත්‍රික්කයේ පැවති අයහපත් කළහාකාරී තත්ත්වය මත එම දිස්ත්‍රික්කයේ නියෝජිතයින් වෙත දිනුම්වාර 04 ක් වෙනුවෙන් නිකුත්කළ සම්පූර්ණ ලොතරැයිපත් 264,000 ම නොවිකුණූ සේ සලකා අදාල දිනුම්වාරවලින් ඉවත් කර තිබුණි. එම නියෝජිතයින් විසින් ඒ වන විට අලෙවිකර තිබූ සියලු ලොතරුයිපත් ද ඇතුලුව සියලුම ටිකට්පත් අවලංගු කිරීමකට ලක්කිරීම සම්බන්ධව මුදල් අමාත්‍යාංශ අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවීය. | පාරිභෝගිකයන් සහ අලෙවි ජාලයට සිදුවන හානි අවම වන ආකාරයේ සුදුසුම ව්‍යාපාරික තීරණයක් වශයෙන් මෙම තීරණය ක්‍රියාත්මක කර ඇති අතර ව්‍යාපාරික තීරණයන් ගැනීමේ බලය අධ්‍යක්ෂක මණ්ඩලය සතු වන බැවින් මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නොවන බව කළමණාකාරිත්වයේ අදහසයි. | පාර්භෝගිකයින්ට අලවිකල ලොතරැයිපත් සම්බන්ධව තීරණ ගැනීමේදී මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය මත සිදු කිරීම. |
| (ඈ) 2018 සැප්තැම්බර් 28 දින දිනුම් අදින ලද ගොවිසෙත 1896 දිනුම්වාරයේදී නොවිකුණූ ලොතරැයිපත් 8,000 ක් 2018 සැප්තැම්බර් 20 දින ජාතික ලොතරැයි මණ්ඩලයේ ගබඩා අංශයට අදාල දිස්ත්‍රික් අලෙවි නියෝජිත භාර දී තිබියදීත් ඒ සඳහා ඉන්වොයිසි නිකුත් නොකිරීම හේතුවෙන් එම ප්‍රමාණය විකුණුම් ලෙස සලකා කටයුතු කර තිබුණි. එම හේතුවෙන් අලෙවි නියෝජිතයා වෙත නැවත ගෙවිය යුතු මුදල හා නියමිත රාජකාරි ඉටු නොකිරීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් 2020 ජුනි 30 වන විටත් සිදුකර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් ආයතනයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විධිමත් පරීක්ෂණයක් සිදුකර, හඳුනාගන්නා ලද පාර්ශවයන් වෙත ඔවුන්ගේ වගකීම ඉටුනොකිරීම හා අතපසුවීම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයන් කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ලොතරැයිපත් භාරගැනීම සම්බන්ධ ක්‍රියාවලිය සංශෝධනය කිරීම . |
| (ඉ) 2018 සැප්තැම්බර් 28 දින දිනුම් ඇදීමට නියමිත ධනනිධානය 55 වන දිනුම්වාරයේ ලොතරැයිපත් 900 ක් සහ මෙගා පවර් 285 වන දිනුම්වාරයේ ලොතරැයිපත් 500 ක් අදාල දිස්ත්‍රික් අලෙවි නියෝජිත වෙත ප්‍රවාහනයේ දී අස්ථානගත වීම හේතුවෙන් එම ලොතරැයිපත් සියල්ල අදාල දිනුම් වාරයේ දී නොවිකුණූ සේ සලකා ඉවත් කිරීම පමණක් සිදුකර තිබූ අතර ඒ සම්බන්ධ විධිමත් පරීක්ෂාවක් සිදුකර අදාල අලාභයන් ගණනය කර ගිණුම් තැබීම සිදුකර නොතිබුණි. | කළමනාකාරිත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව මෙම ලොතරැයිපත් වර්ග 02ට අදාළ බාර්කෝඩ් පරාසයට ඇතුළත් ලොතරැයිපත් ප්‍රමාණයන් 2018.09.28 වන දිනට දිනුම් ඇදීමට නියමිත අදාළ ලොතරැයි දිනුම්වාරයන්ගෙන් ඉවත් කර ඇත. මෙම සිද්ධිය සම්බන්ධයෙන් හඟුරන්කෙත පොලිසිය මඟින් විමර්ශනයක් ද සිදු කරමින් පවතී. | ලොතරැයිපත් නැතිවීම්, අස්ථානගතවීම සම්බන්ධ විධිමත් ක්‍රියාවලියක් හඳුන්වා ක්‍රියාත්මක කිරීම. |
| (ඊ) 2000 අගෝස්තු 23 දින සිට සේවය හැර ගොස් ඇති මණ්ඩලයෙන් දේපල ණය ලබාගත් නිලධාරියෙකුගෙන් එදිනට අයවිය යුතු මුදල රු. 340,275 ක් වී තිබුණි. එම ණය අයකර ගැනීමට 2020 ජුනි 30 දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | එම නිලධාරිවරයාගෙන් අදාල ණය මුදල අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | ණය අය කර ගැනීම් කඩිනම් කල යුතු වීම |

| | | |
|---|---|---|
| (උ) වයඹ පළාතේ 2019 මැයි 13 හා 14 දිනයන්හි පැවති ඇඳිරි නීතිය හේතුවෙන් නියෝජිතයින් සතුව නොවිකුණු ලොතරැයිපත් සියල්ල මණ්ඩලය විසින්ම මිලදී ගැනීමත් එහි ත්‍යාග මණ්ඩලයේ අරමුදලට ලබා ගැනීමත් සිදු කර තිබූ අතර මේ සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2019 මැයි 13, 14 දිනයන්හි වයඹ පළාතේ පැවති ඇඳිරි නීතිය යටතේ ලොතරැයි දිනුම් ඇදීම සම්බන්ධයෙන් පාරිභෝගිකයන් සහ අලෙවි ජාලයට සිදුවන හානි අවම වන ආකාරයේ සුදුසුම ව්‍යාපාරික තීරණය වශයෙන් මෙම තීරණය අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත ක්‍රියාත්මක කර ඇත. | තීරණ ගැනීමේදී ප්‍රධාන ගණන් නිලධාරීගේ අනුමැතිය සිදු කිරීම. |

**3.6 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් මිලදී ගන්නා ලද රු.1,000,000 ක් වටිනා ලොතරැයි දිනුම් ඇදීමේ යන්ත්‍රයක් සඳහා මණ්ඩලය විසින් රු.329,693 ක අළුත්වැඩියාවක් සිදුකර තිබුණු අතර මේ වන තෙක් එය ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව තබා තිබුණි. | මෙම යන්ත්‍රය පූර්ණ වශයෙන් ක්‍රියා කරවීමේ හැකියාව පැවතී ඇත. මෙම යන්ත්‍රයේ පාලන කොටස වසර 8 ක පමණ කාලයක සිට මහජන සම්පත දිනුම් ඇදීමේ යන්ත්‍රයේ අක්‍රියව පැවති පාලන පද්ධතිය සඳහා ආදේශක අංගයක් වශයෙන් යොදා ගෙන ඇත. මේ වන විටත් භාවිතා කරනුයේ එම පද්ධතියයි. ලොතරැයි මණ්ඩලයේ නව අවශ්‍යතාවයන්ද සැලකිල්ලට ගෙන නව යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත. | ප්‍රයෝජනයට නොගන්නා භාණ්ඩ සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත සුදුසු කටයුත්තක් සිදු කිරීම. |

**3.7 ප්‍රසම්පාදන කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලය විසින් වෙළෙඳපොළට ඉදිරිපත් කර ඇති ක්ෂණික ලොතරැයි වර්ග දෙකක මුද්‍රණ කටයුතු සඳහා ප්‍රසම්පාදනයෙන් තෝරාගත් මුද්‍රණකරුට එම ප්‍රසම්පාදනය පිරිනැමීම 2020 පෙබරවාරි 12 දින සිදු කර තිබුණි. එහෙත් අදාල මුද්‍රණකරු සතුව නියමිත මුද්‍රණ ද්‍රව්‍යයන් නොතිබීම හේතුවෙන් 2020 ජුනි 30 දින වන විටත් ගිවිසුම් ගතවී නොමැති අතර එහි මුද්‍රණ කටයුතු පැරණි මුද්‍රණකරුගෙන්ම සිදු කරගෙන තිබුණි. | ක්ෂණික ලොතරැයිපත් මුද්‍රණය සඳහා තේරී පත් වූ නව මුද්‍රණකරු වන සිලෝන් බිස්නස් ඇප්ලයන්සස් ආයතනය වෙත ක්ෂණික ලොතරැයිපත් මුද්‍රණ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම 2020.02.12 වන දින සිදු කර ඇති අතර එම ආයතනය විසින් 2020.05.01 වන දින සිට මුද්‍රණ කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර තිබේ. නමුත්, 2020 මාර්තු මස අග භාගය වන විට ලොව පුරා පැතිර පැවතුන කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් එම මුද්‍රණකරු විසින් ඇණවුම් කරන ලද අමුද්‍රව්‍ය සහ මුද්‍රණ උපාංග නියමිත කාලවකවානුව තුල ආනයනය කර ගැනීමට නොහැකි බව දැනුම් දී ඇත. ඒ අනුව, නියමිත අමුද්‍රව්‍ය ලැබෙන තෙක් තාවකාලික පදනම මත ඉතාමත් කෙටි කාලයක් සඳහා අනුමත ප්‍රමාණ පිරිවිතරයෙන් | ප්‍රසම්පාදන කමිටුවේ තීරණය මත ඉදිරි කටයුතු තීරණය කිරීම. |

| | | |
|---|---|---|
| | බැහැරව ලොතරැයිපත් මුද්‍රණය කිරීමට මුද්‍රණකරු විසින් කරන ලද ඉල්ලීමකට අනුව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත 2020.06.16 වන දින සිට ක්ෂණික ලොතරැයිපත් මුද්‍රණ කටයුතු ආරම්භ කිරීමට උපදෙස් ලබා දී ඇත. | |
| (ආ) 2018 වර්ෂයේදී රු.2,400,000 ක් වැයකර මිලදී ගෙන තිබූ සූර්ය පැනල 500 කින් 2020 ජුනි 16 දින වන විටත් රු.1,212,426 ක් වටිනා සූර්ය පැනල 267 ක තොගයක් ගබඩාවේ පැවතුණි. මෙම ප්‍රසම්පාදනයේදී අවශ්‍යතාවය මෙන්ම ප්‍රතිලාභීන් ද නිශ්චය කර නොතිබූ අතර ඒවායේ වගකීම් කාලයද ගබඩාවේදීම ඉක්මවා ගොස් තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලීන් හි පවතින ප්‍රායෝගික දුෂ්කරතාවයන් හේතුවෙන් නියමිත කාලයන් හිදී එම භාණ්ඩ ලබා ගැනීමට නොහැකි වී ඇත. නමුත්, අදාළ භාණ්ඩ ලැබීමෙන් පසුව හඳුනාගන්නා ලද අවශ්‍යතාවයන් සඳහා මෙම සූර්ය තාප පද්ධති ලබා දීම සිදු කළ අතර මේ වන විට එයින් සූර්ය තාප පද්ධති 150ක් පමණක් ගබඩාවේ ඉතිරිව පවතින අතර එම ප්‍රමාණය ද හඳුනා ගන්නා ලද අවශ්‍යතාවයන් සුදුසු පරිදි ලබා දීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | නොපමාව අදාල භාණ්ඩ ප්‍රයෝජනයට ගත හැකි ක්‍රියාමාර්ග ගැනීම. |
| (ඇ) 2019 වර්ෂයේදි මණ්ඩලය විසින් ප්‍රවර්ධන අයිතමයන් වර්ග 41 ක් වෙනුවෙන් රු.168,511,500 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණද එම වර්ෂය තුලදී ප්‍රසම්පාදන කටයුතු නිමකර තිබුණේ අයිතම 12 ක් පමණක් වූ අතර ඒවායේ වටිනාකම රු.50,986,500 ක් විය. | ප්‍රවර්ධන අයිතමයන් 31ක් ප්‍රසම්පාදන සැලසුමෙහි ඇතුලත් කර ඇති අතර එම වර්ෂය තුලදී ප්‍රවර්ධන අයිතමයන් 15 පමණ නිමකර ඇත. නමුත් ප්‍රසම්පාදන සැලසුමෙහි ඇතුලත් කලද අවශ්‍යතාවය මත එනම් වෙළඳපොළ හැසිරීම්, තරගකාරී ආයතනයේ ප්‍රවර්ධන වැඩසටහන්ද සැලකිල්ලට ගෙන අත්‍යාවශ්‍ය භාණ්ඩ පමණක් අලෙවි අංශයේ ඉල්ලීම පරිදි මිලදී ගැනීම සිදු කර ඇත. | නියමිත කාලයට ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට සැලසුම් කල යුතු වීම. |
| (ඈ) 2018 වර්ෂයේ දී රු.13,128,900 ක් වටිනා ලොතරැයි අලෙවි කුටි 300 ක් නිෂ්පාදනය කර සැපයීමට 2019 පෙබරවාරි මස ඇනවුම් ලබා දී තිබුණ. එහෙත් 2019 ජූලි 10 දින වන විට සපයා තිබුණු අලෙවි කුටි සංඛ්‍යාව 51 ක් විය. තවදුරටත් සැපයීමට තිබෙන අලෙවි කුටි නොසැපයීම හේතුවෙන් අදාල සැපයුම්කරුගෙන් ඒ සඳහා ප්‍රමාද ගාස්තු ලෙස රු.847,689 ක්ද තබා ඇති ඇප බැඳුම්කර මුදල වූ රු.1,509,823 ක මුදලක්ද ඔහුගෙන් අයකර එම ගිවිසුම අවලංගු කර තිබුණි. ඒ සඳහා නව ප්‍රසම්පාදන කටයුතු 2020 ජුනි 30 දින දක්වා සිදු කර නොතිබුණි. | මෙම අලෙවි කුටි නොසැපයීම හේතුවෙන් අදාල සැපයුම්කරුගෙන් ප්‍රමාද ගාස්තු ලෙස රු. 847,689.00 ක්ද, කාර්ය සාධන ඇප බැඳුම්කරය රු. 1,509,823.00 ක මුදලද අයකර ගෙන ඇත. නැවත ප්‍රසම්පාදන කටයුතු 2020 ජූලි මස 07 දින ආරම්භ කර ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය නැවත සිදු කිරීමට කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| (ඉ) 2016 ජුලි මාසයේදී හා 2018 මැයි මාසයන්වලදී ආරම්භ කළ සෙවණ හා ධන නිධානය යන ලොතරැයි 02 හි මුද්‍රණ කටයුතු ප්‍රසම්පාදනයකින් තොරව මුද්‍රණකරුවන් දෙදෙනෙකු වෙත අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකින් පවරාදී තිබුණි. එසේම මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ මෙහෙයවා තිබුණු ලොතරැයි වර්ග 10 කින් ලොතරැයි වර්ග 04 ක ප්‍රසම්පාදන කාලය 2019 අගෝස්තු අවසන් වී තිබුණද නව ප්‍රසම්පාදන කටයුතු 2020 ජුනි 30 තෙක් සිදු කර නොතිබු අතර අනෙකුත් ලොතරැයි වර්ග 06 ක් සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව මුද්‍රණකරුවන් තෝරාගෙන තිබුණි. | සෙවණ හා ධන නිධානය ලොතරැයිපත් වෙළඳපොළට හඳුන්වා දීමේදී එවකට පැවති හදිසි අවශ්‍යතාවය මත අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත සුදුසු සැපයුම්කරුවන් තෝරා පත් කර ගන්නා තෙක් තාවකාලික පදනම මත මුද්‍රණය භාරදී ඇත. සියළුම ලොතරැයිපත් සඳහා එකවර ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලෙස අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් උපදෙස් ලබා දී ඇත. ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරීම සම්බන්ධයෙන් පැවති ප්‍රායෝගික අපහසුතාවය මත නැවත වරක් 2020 මැයි මස සිට සැප්තැම්බර් දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. මේ වන විට නව මුද්‍රණකරුවන් තෝරා ගැනීම සඳහා වන ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරමින් පවතී. | ප්‍රසම්පාදන කටයුතු නියමිත කාල රාමුවකට සැලසුම් කර ක්‍රියාත්මක කිරීම. |
| (ඊ) මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන මහජන සම්පත ලොතරැයියේ මුද්‍රණ කටයුතු 2008 වර්ෂයේ සිටද නීරෝගා ලොතරැයියේ මුද්‍රණ කටයුතු 2015 වර්ෂයේ සිටද මෙගාපවර් ලොතරැයියේ මුද්‍රණ කටයුතු 2018 වර්ෂයේ සිටද රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව විසින් මේ දක්වා ඉටු කර තිබු අතර මේ සඳහා ලිඛිත ගිවිසුමක් නොවීය. ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් එක් ටිකට්පතක් මුද්‍රණය කිරීම සඳහා ලැබී ඇති අවම මිල රු.0.3448 ක් වුවද රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත මහජන සම්පත එක් ලොතරැයිපතක් මුද්‍රණ කිරීම වෙනුවෙන් රු.0.50231ක්ද මහජන සම්පත, නීරෝගා සහ මෙගාපවර් ලොතරැයිපතක මුද්‍රණ පිරිවැය රු.0.50231 ක්ද ලෙස ගෙවමින් පැවතුණි. තරඟකාරී මිල ගණන් සැලකිල්ලට නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වෙනුවෙන් මහජන සම්පත ලොතරැයිපත් මුද්‍රණයෙන් ඇස්තමේන්තුගත අලාභය දල වශයෙන් රු.52,396,404 ක්ද, නීරෝගා ලොතරැයිපත් මුද්‍රණයෙන් ඇස්තමේන්තුගත අලාභය දළ වශයෙන් රු.8,709,206 ක්ද මෙගා | මහජන සම්පත ලොතරැයියේ මුද්‍රණ කටයුතු අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව මගින් කරනු ලබයි. මුද්‍රණ කොන්ත්‍රාත් ගිවිසුම 2020.07.06 වන දින අත්සන් කර ඇත. මහජන සම්පත මුද්‍රණය කරනුයේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත රාජ්‍ය ආයතනයක් මගින් බැවින් මුද්‍රණ ගාස්තුවේ සංශෝධන කිරීමක් සිදු කිරීමට නොහැකි වී ඇත. නමුත් මිල සංශෝධනය කර ගැනීම සඳහා ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට යෝජිතය. සඳහා එකවිට ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, මේ වන විට නව ප්‍රසම්පාදනයේ වැඩ කටයුතු සිදු කරමින් පවතී. | ආර්ථික වශයෙන් වාසිදායක ලෙස මුද්‍රණ මිලගණන් සංශෝධනය සඳහා කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| පවර් ලොතරැයිපත් මුද්‍රණයෙන් අලාභය දළ වශයෙන් රු.21,529,523 ක්ද වී තිබුණි. | | |
| (උ) 2018 වර්ෂයේ පරිගණකාශ්‍රිත ලොතරැයිපත් මුද්‍රණය සම්බන්ධයෙන් වූ පිරිවිතරයෙහි සඳහන් අවශ්‍යතාවයන්ට පටහැනි ලෙස පිරිවැය අඩු කඩදාසි භාවිතා කිරීම, නියමිත ප්‍රමිතීන් ආරක්ෂා නොවන පරිදි අදාල මුද්‍රණයන් සිදු කිරීම හා ද්විත්ව ලොතරැයිපත් මුද්‍රණයන් සිදු කිරීම යනාදි අඩුපාඩු සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. නිදසුන් ලෙස 2019 ජනවාරි 13 දින පැවැත්වූ ගොවිසෙත දිනුම් වාරය සඳහා අදාල මුද්‍රණකරු විසින් ලොතරැයිපත් 30 ක් දෙවරක් මුද්‍රණය කර සැපයීම හා තවත් මුද්‍රණකරුවන් විසින් ලොතරැයිපත්වල විශාලත්වය අඩුකර මුද්‍රණය කිරීම නිසා රු.9,472 ක අතිරේක ලාභයක් ලබා ගෙන තිබුණි. | ලොතරැයිපත් අදාළ ලංසු කැඳවීමේ පිරිවිතරයට පරිබාහිර ලෙස ලොතරැයිපතක විශාලත්වය අඩුකර මුද්‍රණය කිරීම සම්බන්ධව එම ආයතනය වාචිකව මෙන්ම ලිඛිතවද දැනුවත් කර ඇත. මුද්‍රණකරු විසින් ප්‍රමාණ පිරිවිතරයෙන් බැහැරව ලබා ගත් පිරිවැය ඉතිරිය ලෙස විගණන අංශය විසින් ලබා දී ඇති වාර්තාවේ සඳහන් වටිනාකම ඔවුන්ට ගෙවීමට නියමිත අදාළ මුද්‍රණ ගාස්තුවෙන් අඩු කිරීමට බලාපොරොත්තු වේ.<br>ඉදිරියේදී මෙවැනි දෝෂ අවම කර ගැනීම සඳහා අදාළ ලොතරැයි කාණ්ඩ අංකයන්, දිනයන්, ඉලක්කම්, මුද්‍රණ අකුරු පිළිබඳ පරීක්ෂාවක් සිදු කර ඒවායේ නිවැරදිභාවය පිළිබඳ තත්ත්ව සහතිකයක් දිනුම්වාරයෙන් වාරයට අදාළ ලොතරැයි මුද්‍රණකරුගෙන් ලබා ගැනීමටද, ලොතරැයි මුද්‍රණයේදී සිදු වන සියලුම දෝෂ සම්බන්ධයෙන් මුද්‍රණකරුගෙන් දඩ මුදලක් අයකර ගත හැකි වන පරිදි වගන්තියක් මුද්‍රණ ගිවිසුමට ඇතුළත් කිරීමට කටයුතු කිරීමට ද බලාපොරොත්තු වේ. මුද්‍රණාලයේදී වැරදි ලෙස ලොතරැයිපතක් මුද්‍රණය වූයේ නම් ඒ පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් සෑම දිනුම් වාරයකටම අදාළව මුද්‍රණකරුගෙන් ලබා ගැනීමටද ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. | අදාල ප්‍රමිතීන් අනුව කටයුතු කිරීමට සෑම විටම උත්සාහ ගැනීම. |
| (ඌ) මණ්ඩලය විසින් ලොතරැයිපත් මිලදී ගන්නන්ගේ ආරක්ෂාවට සියලුම දත්තයන් QR Code එකකට ඇතුලත් කර මුද්‍රණය කරන ලෙස මුද්‍රණකරුවන්ට උපදෙස් දී තිබුණද අදාල මුද්‍රණකරුවන් විසින් එම ආරක්ෂිත ක්‍රමවේදය අනුගමනය කිරීමේදී නිවැරදි නොවන QR Code මුද්‍රණය කල අවස්ථා නිරීක්ෂණය විය. එම ක්‍රමවේදය පරීක්ෂා කිරීම සඳහා | පාරිභෝගික ආරක්ෂාව සඳහා සත්‍ය ලොතරැයි පතක් හඳුනා ගැනීම පහසු කරවීමට සහ ඒ තුළින් ඉදිරියේදී ලොතරැයි දිනුම් පිළිබඳ පාරිභෝගිකයන් හට ස්වයංක්‍රීයව වෙබ් අඩවිය හරහා ලොතරැයිපත් දිනුම් සත්‍යාපනය සඳහා ද QR Code ලොතරැයිපතට හඳුන්වාදී ඇත. එසේම QR Code පරීක්ෂාව හුදෙක් පොදු පාරිභෝගික ජනතාව සඳහා කිසිදු විශේෂිත උපකරණයක් | හඳුන්වාදෙනු ලබන ආරක්ෂික ක්‍රමවේද අනුගමනය කිරීමට කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| භාවිතයට ගන්නා උපකරණද මණ්ඩලය සතුව නොවුනි. එසේම ජයග්‍රාහකයින් විසින් ඉදිරිපත් කරන ලොතරැයිපත් වෙනුවෙන්ද එම පරික්ෂාව මණ්ඩලය විසින් ඉටු කර නොතිබුණි . | භාවිතයකින් තොරව ස්මාර්ට් ජංගම දුරකථනයක් ආධාරයෙන් නොමිලේ බාගත කළ හැකි මෘදුකාංග භාවිතයෙන් ඉතා පහසුවෙන් සිදු කළ හැක. ඒ සඳහා විශේෂිත වූ උපකරණ අවශ්‍ය නොවේ. එහෙයින් මෙහි සඳහන් කර ඇති ආකාරයට මණ්ඩලයේ අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගැනීමක් නොව ඉතා සාර්ථක ප්‍රතිඵල ලබාගෙන ඇති අතර එහි දෙවන පියවර ක්‍රියාත්මක කිරීම සඳහා ද ඉදිරි පියවර ගනිමින් පවතී. | |
| (එ) 2018 වර්ෂයේදී මණ්ඩලය විසින් කුළියට ලබාගත් වර්ග අඩි 26000 ක ගොඩනැගිල්ල සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව ලබාදුන් මාසික තක්සේරු වටිනාකම රු.3,750,000 ක් වුවද ඒ සඳහා ගෙවනු ලබන මාසික කුලී වටිනාකම රු.7,677,173 ක් විය. එයට යාබදව යකඩ කණු මත ඉදිකළ වර්ග අඩි 4885 ක ගොඩනැගිල්ලක් රු.1,099,125 ක මාසික කුළියට ලබාගෙන තිබුණි. එම ගොඩනැගිලි සඳහා වු සැලැසුම, පදිංචියට සුදුසු බවට සහතිකය, නගරසභා අනුමැතිය හා තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වටිනාකම යනාදිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ගොඩනැගිල්ලේ වර්ග අඩියකට එකතු කල අගය මත බදු රහිත මුදල වන වර්ග අඩියකට රු.270 ක කුලී මුදලකට එනම් මසකට රු.7,677,173 ක මුදලකට හා මෙම ගොඩනැගිල්ලෙහි පිටුපස කොටසට යාබදව ඉදි කරන ලද වර්ග අඩි 2,880ක ගොඩනැගිල්ල කුලී පදනම මත වසර 2ක කාලයක් සඳහා ද ලබා ගැනීමට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්ම හා පදිංචියට සුදුසු බවට සහතිකය (OC) ලබා ගැනීම සඳහා ගොඩනැගිලි හිමිකරු අවස්ථා කිහිපයකදී දැනුවත් කර ඇත. | තක්සේරු දෙපාර්තමේන්තු කුලී රෙටයන්ට ගිවිසුම්ගත වීමත් නියමිත අනුමැතීන් මත ඉදිකිරීම් සිදු කල ගොඩනැගිලි කුලියට ගැනීමට කටයුතු කිරීම මත අදාල ගාස්තු ගෙවීම. |

**3.8 මානව සම්පත් කළමනාකරණය**

.............................................

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව එකඟතාවය නොමැතිව මණ්ඩලයේ අනුමත මූල්‍ය නිලධාරී තනතුර යටපත් කර අලෙවි/ ප්‍රවර්ධන නිලධාරී තනතුරක් ඇතිකර තිබුණි. එම තනතුර සඳහා නිශ්චිතව සුදුසුකම් සඳහන් කිරීමෙන් තොරව කළමනාකරණ සහකාර තනතුරක් දරන අයකු 2017 අගෝස්තු 08 දින සිට පත්කර තිබුණි. එම තනතුරට පත් කළ නිලධාරියාගේ වැටුප් වර්ධක 03 ක් විලම්භනය කරන ලෙස නියෝග කර තිබියදී එසේ කටයුතු කිරීමකින් තොරව නව තනතුරේ වැටුප් ගෙවීම් කර තිබුණි. | පැරණි සේවකයින් අභිප්‍රේරණය කිරිමේ අරමුණ පෙරදැරිව හා ආයතනයේ රාජකාරී අවශ්‍යතාවය මත අනුමත තනතුරු සංඛ්‍යාව තුල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් තාවකාලිකව තනතුරු නාමය වෙනස් කර උසස් වීම් ලබා දී ඇත. | අනුමැතීන් මත තනතුරු සඳහා පත් කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සහාකාර සාමාන්‍යාධිකාරි අලෙවි ප්‍රවර්ධන තනතුරට බඳවාගෙන සිටි නිලධාරියා සහකාර සාමාන්‍යාධිකාරි ණය අයකර ගැනීම් තනතුරට අනුයුක්ත කර තිබුණි. එහෙත් සහකාර සාමාන්‍යාධිකාරි ණය අයකර ගැනීම යනුවෙන් තනතුරක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබූ අතර එම තනතුරට අනුයුක්ත කල නිලධාරියාගේ නිත්‍ය තනතුරේ රාජකාරි ආවරණය වීමක්ද සිදු වී නොතිබුණි. අනුමත නොවූ එම තනතුරට විධිමත් රාජකාරි හා කාර්යය පැවරුමක්ද සිදු නොකර ඔහුට වැටුප් හා දීමනා ලෙස 2020 මැයි 31 දින වන විට රු.1,438,805 ක් ගෙවා තිබුණි. | මේ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරි කටයුතු කර ඇති අතර මේ තුළින් සංවිධාන ව්‍යුහයේ තනතුරු සංඛ්‍යාව ඉක්මවා යාමක් සිදුවී නොමැත. එමගින් ඔහුගේ තනතුර අහිමිවීමක් හෝ ඒ සඳහා වන ප්‍රතිලාභ අහිමි කිරීමක් සිදු වී නොමැති අතර සිදුව ඇත්තේ නව රාජකාරි පැවරීමක් හා තනතුරු නාමය වෙනස් වීමක් පමණි. | සුදුසුකම් අනුව බඳවාගෙන ඇති තනතුරු සඳහා රාජකාරි කටයුතු කිරීමට. |
| (ඇ) | ගිවිසුම්ගත වීමකින් හා විධිමත් කාර්යය පැවරුමකින් තොරව පවත්නා පරිගණක පද්ධතියේ ගැටලු හඳුනාගැනීම, නිවැරදි කිරීම හා නව යෝජනා ලබාගැනීම සඳහා 2017 වර්ෂයට පෙර මොරටුව විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයෙකු පත්කර ඇතත් එම කාර්යය නිසි පරිදි ඉටුකර නොතිබුණි. නැවතත් එම කාර්යය ඉටුකර ගැනීම සඳහා 2019 වර්ෂයේදී මණ්ඩලයේ අනුමත බඳවා ගැනීමේ කාර්යය පරිපාටි රීති සංග්‍රහයට පටහැනි ලෙස අධ්‍යක්ෂකමණ්ඩල සාමාජිකයෙකුගේ නිර්දේශයෙන් උපදේශක වරයෙකු පත්කර තිබුණි. එම කාර්යය සඳහා ඔහුට මුලිකව රු.350,000 ක්ද පසුව දෙවන අදියර යටතේ රු.250,000 ක්ද වශයෙන් එකතුව රු.1,364,948 ක් ගෙවීම් කර තිබුණි. මණ්ඩලය විසින් පසුව උපදේශක තනතුරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරියකු බඳවා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශ අනුමැතියට ලිපියක් යවා තිබුණි. මුදල් අමාත්‍යාංශය විසින් මාසිකව රු.80,842 ක් ගෙවීම සඳහා අනුමැතිය දී තිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් යථොක්ත බඳවා ගැනීම මත අනාර්ථිකව මාසයකට ගෙවා ඇති මුදල රු.1,014,948 ක් විය. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (තොරතුරු තාක්ෂණ) තනතුරෙහි පුරප්පාඩු සම්පූර්ණ කරන තෙක් මාස 06ක කාලයකට කොන්ත්‍රාත් පදනමින් තොරතුරු තාක්ෂණ උපදේශකවරයෙකු බඳවා ගැනීමට මුදල් අමාත්‍යාංශ අනුමැතිය ලබා දී ඇත. එමෙන්ම මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය මත 2019 අප්‍රේල් මස සිට මෙම උපදේශකවරයා සඳහා මාසිකව රු. 80,842/- බැගින් ගෙවීම් සිදු කර ඇත. එහෙත් මෙම උපදේශකවරයා වෙත රු. 350,000 ක මුදල සහ මාසිකව රු. 250,000ක මුදල ගෙවීම් කිරීම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සිදු කර ඇති අතර එය මුදල් අමාත්‍යාංශය වෙතින් මාසික ගෙවීම් සීමාව දක්වා එවීමට පෙර සිදු කරන ලද ගෙවීමකි. | විධිමත් කාර්ය පැවරුමත් සිදුකර අදාල කාර්යය ඉටුකර ගැනීමට කටයුතු කිරීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ ගිණුම් වර්ෂය අවසාන වී ඊළග වර්ෂයේ පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ 2020 මැයි 12 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | ජාතික ලොතරැයි මණ්ඩලය මාර්තු මස 10 වන දින වන විට මූල්‍ය ප්‍රකාශන සැකසීම අවසන් කර අතිනත යවා අත්සන් කර ගන්නා අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා මාර්තු මස 13 වන දින වන විට සකස් කල නමුත් ඒ වන විට රට පුරා පැතිර ගිය කොරෝනා වසංගත තත්ත්වය මත රජය මගින් නිවාඩු තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීම හා ඉන්පසු ඇඳිරි නීතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර අනුමැතිය ලබා ගැනිම ප්‍රමාද වූ හෙයින් විගණාධිපති වෙත මැයි මස 12 දින ඉදිරිපත් කරන ලදී. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කිරීම. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආයතනය ආරම්භ කර වසර ගණනාවක් ගතවී තිබුණද ආයතනයේ යටිතල පහසුකම් වැඩි දියුණු කර ගැනීමට අදාළව කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි. | ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා අංක 55/57 දරණ වොක්ෂෝල් පටුමග, කොළඹ 02 ස්ථානයේ පර්චස් 112ක ඉඩමක් 2009 වසරේදී මිලදී ගෙන ඇති අතර එය මිලදී ගැනීමේ පරමාර්ථය වී ඇත්තේ ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා අවශ්‍ය සියළුම යටිතල පහසුකම් සහිත සේවා ස්ථානයක් ඉදිකිරීමයි. ඒ සඳහා අවශ්‍ය සියළුම මූලික කටයුතු අවසන් කලද රජයේ පැවති ප්‍රතිපත්තිය වූ රාජ්‍ය ආයතන සඳහා නව ගොඩනැගිලි ඉදි කිරීමට අවසර නොදෙන ප්‍රතිපත්තිය මත එම කාර්යය ඉදිරියට ගෙන යාමට නොහැකි වී ඇත. | ආයතනයේ යටිතල පහසුකම් මොනවාද යන්න හඳුනාගෙන ඒවා ඉටුකර ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) 2003 ජූනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 ප්‍රකාරව මානව සම්පත් කළමනාකරණය සඳහා වූ අත්පොතක් පිළියෙල කර නොතිබුණි | මානව සම්පත් කළමනාකරණය සඳහා වූ අත්පොත පිළියෙල කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | මානව සම්පත් කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කිරීම. |
| (ඇ) මණ්ඩලයේ 2018 හා 2019 වර්ෂයන්ට අදාළ ලොතරැයිපත් ආදායම හා | 2018 වර්ෂයේ ආරම්භය දිනුම් ඇදීම සිදුකල සම්පත් රේඛා සහ සුපිරි දෙලක්ෂපති යන ලොතරැයි වර්ග 02 | නිසි අධ්‍යානයකින් ලොතරැයි |

| | | |
|---|---|---|
| ප්‍රචාරණ වියදම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.<br>(i) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ලොතරැයි වර්ග 07 ක ආදායම ඉහළ ගොස් තිබුණද, ලොතරැයි වර්ග 05 ක ආදායම පහළ ගොස් තිබුණි. ඒ අනුව සමස්ථ ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 1641 කින් වැඩි වී තිබු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 8.03 ක් වේ. | වෙළඳපලට නිකුත් කිරීම අත්හිටුවා ඒ වෙනුවට ධන නිධානය නමින් සතියකට දින තුනක් දිනුම් ඇදීම සිදු කරන අයුරින් ලොතරැයිපතක් වෙළඳපලට නිකුත් කිරීම සිදුකර ඇත. සමාලෝචිත වර්ෂය තුල දෛනික දිනුම් අදින ලොතරැයි 9ක් පමණක් වෙළඳපලට නිකුත් කිරීම සිදු කර ඇත. 2018 වසර තුල සම්පත් රේඛා, සුපිරි දෙලක්ෂපති සහ ධන නිධානය යන ලොතරැයිපත් තුනෙන්ම ලද අලෙවි ආදායම හා 2019 වසර තුල ධන නිධානය මඟින් ඉපැයූ ආදායම හා සැසඳීමේදී මිලියන 71ක අලෙවි ආදායමේ වර්ධනයක් ඇත. මීට අමතරව ගොවිසෙත, ජාතික සම්පත, මහජන සම්පත, මෙගා පවර් සහ වාසනා සම්පත යන ලොතරැයි වර්ග 5ක අලෙවියේ වර්ධනයක් නිරීක්ෂණය කල හැක.<br>නීරෝගා සහ සෙවණ යන ලොතරැයි වර්ග දෙක සැලකීමේදී පිළිවෙලින් 2018 වසරට සාපේක්ෂව 2019 වසර තුල 99.57% හා 99.25% වන ලෙස අලෙවි ආදායමක් උපයා ඇති අතර ලොතරැයි දෙකෙහිම දෛනික සාමාන්‍ය අලෙවිය සුළු වර්ධනයක් සහිතව පවත්වාගෙන තිබේ. තවද ලොතරැයි දෙකේ අලෙවි ආදායමෙහි මෙම සුළු පසුබෑමට හේතුව ලෙස 2018 වසරට සාපේක්ෂව 2019 වර්ෂය තුල පැවැත්වීමට යෙදුනු දිනුම්වාරයන්හි අඩුවීම හඳුනා ගත හැක. 2018 වර්ෂය තුල නීරෝගා දිනුම් වාර 153ක් පවත්වා තිබූ අතර 2019 වර්ෂය තුල පවත්වා තිබූයේ දිනුම්වාර 151 පමණි. මීට අමතරව සෙවණ දිනුම්වාර 52ක් 2018 වර්ෂයේ පවත්වා තිබූ අතර 2019 වර්ෂය තුල එම අගය 51 විය.<br>සමස්තයක් ලෙස ගත්කල 2019 තුල 2018 වර්ෂයට සාපේක්ෂව රුපියල් මිලියන 1763 අලෙවි වර්ධනයක් ලබාගෙන ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස 8.99%ක් විය. තවද, දෛනිකව දිනුම් ඇදීම් සිදුකල ලොතරැයි වර්ග 6ක් අලෙවි ආදායම වර්ධනය කොටගෙන තිබූ අතර ලොතරැයි වර්ග දෙකක අලෙවි ආදායමේ සුළු වශයෙන් අඩු වුවත් දෛනික සාමාන්‍ය අලෙවිය සුළු වර්ධනයක් සහිතව ගෙන තිබෙනු නිරීක්ෂණය කල හැක. සුපිරි වාසනා ලොතරැයිය පමණක් සමාලෝචිත වර්ෂය තුල අලෙවි ආදායමේ සැලකිය යුතු පහල වැටීමක් නිරීක්ෂණය විය. මෙම නිරීක්ෂණයන් මත පදනම්ව 2020 ජූනි මස වනවිට ත්‍යාග රටාවන්හි වෙනස්කම් සහිතව පාරිභෝගික ආකර්ශනය වැඩි වශයෙන් යොමු කර ගන්නා අයුරින් නැවත දියත් කිරීම සිදුකොට ඇත. | වෙළඳපොලට හඳුන්වා දීම හා නතර කිරීම. |
| (ii) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සුපිරි වාසනා, නීරෝගා සහ සෙවණ ලොතරැයිවල ආදායම පිළිවෙලින් | සතියට දින 2ක් හෝ 3ක් දිනුම් අදින ලොතරැයිපත් සඳහා එම ලොතරැයි වෙළඳපොල තුල ආරක්ෂා කර ගැනීමට දරනු ලැබූ උත්සාහයන් නිසා වැඩි ප්‍රචාරණ | නිසි අධ්‍යානයක් මත ප්‍රචාරණ වියදම් දැරීම. |

| | | |
|---|---|---|
| සියයට 15, සියයට 04 සහ සියයට 10 කින් අඩුවන විට එහි ප්‍රචාරණ වියදම සියයට 4, සියයට 10 සහ සියයට 3 කින් ඉහළ ගොස් තිබුණි. | වියදමක් දැරීමට සිදු වී ඇත. | |
| (iii) රු.මිලියන 7,316 ක ඉහලම ආදායමක් උපයා ඇති ගොවිසෙත ලොතරැයියේ ප්‍රචාරණ පිරිවැය විකුණුම් ආදායමින් සියයට 2.6 ක් ලෙස පහලම අගයක් ගෙන තිබුණි. පිළිවෙලින් රු.මිලියන 424, රු.මිලියන 731, රු.මිලියන 972 සහ රු.මිලියන 1236 ක ආදායමක් උපයා ඇති වාසනා සම්පත, සුපිරි වාසනා, නිරෝගා හා ධනනිධානය ලොතරැයිවල ප්‍රචාරණ පිරිවැය විකුණුම් ආදායමින් සියයට 13, සියයට 11, සියයට 10 සහ සියයට 8 ක ඉහළ අගයක් ගෙන තිබුණි. | ගොවිසෙත ලොතරැයිය සතියේ දින 7ම දිනුම් අදින ලොතරැයියක් වන අතර එහි විකුණුම් අදායම ඉහල අගයක් ගනී. සුපිරිවාසනා, නිරෝගා, ධන නිධානය දින 2ක් හෝ 3ක් දිනුම් අදින ලොතරැයි වේ. එම ලොතරැයි වෙළඳපොල තුල ආරක්ෂා කර ගැනීමට දරනු ලැබූ උත්සාහයන් නිසා වැඩි ප්‍රචාරණ වියදමක් දැරීමට සිදු වී ඇත. | එම |
| (ඇ) ඉකුත් වර්ෂයේදී පැවැත්වූ ලොතරැයි දිනුම්වාර සංඛ්‍යාව 1415 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එම සංඛ්‍යාව 1423 ක් දක්වා දිනුම්වාර 08 කින් වැඩි වී තිබුණි. ලොතරැයි අලෙවි ආදායම පසුගිය වර්ෂයට වඩා රු.1,640,617,135 කින් හෙවත් සියයට 8.03 ක ප්‍රතිශතයකින් වැඩි වී තිබුණි. | 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂය තුල ඉපැයූ සමස්ත ආදායම රු. මිලියන 1763 කින් වැඩි වී ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස 8.99% ක් වේ. නව ලොතරැයිපතක් ලෙස ධන නිධානය ලොතරැයිපත සතියට දින තුනක් බැගින් දිනුම් අදින අයුරින් (මැයි 25 පළමු දිනුම් වාරය) වෙළඳපලට නිකුත් කර ඇත. මේ හේතුවෙන් සතියට ලොතරැයි දිනුම්වාර 27 ලෙස පැවති ලොතරැයි මිශ්‍රය සතියකට දිනුම් වාර 28ක් පවත්වන අයුරින් වෙනස් කිරීම සිදු කර ඇත.<br>සාමාන්‍ය ලොතරැයි මිශ්‍රයේ දිනුම් ඇදීමට තිබූ ලොතරැයි වාර 9ක් නොපැවැත්වීමට කළමණාකාරීත්වය තීරණය කර ඇත. මීට අමතරව ජනාධිපතිවරණ, මහා මැතිවරණය වැනි ප්‍රධාන මැතිවරණයන්ට පසුදින අලෙවියේ සැලකිය යුතු අඩුවීමක් නිරීක්ෂණය කල හැකි අතර අගෝස්තු 16 දිනට යෙදුනු ජනාධිපතිවරණයට පසුදින ඉහත නිරීක්ෂණයන්ට පදනම්ව පැවැත්වීමට නියමිතව තිබූ දිනුම් වාරයන් 4 අවලංගු කර ඇත.<br>මේ හේතුවෙන් 2018 වසරට සාපේක්ෂව 2019 වර්ෂය තුල අමතර දිනුම්වාර 20ක් පැවැත්වූ නමුත් වෙළඳපල තත්ත්වය හා ආයතනික ලාභය සලකා බලා සිදු කරන ලද ලොතරැයි මිශ්‍රයට පරිබාහිරව සිදුකල වෙනස්කම් හේතුවෙන් දිනුම් වාර 13ක් අවලංගු කර ඇත. සමස්තයක් ලෙස 2018 වසර තුල දිනුම් වාර 1416 හා 2019 වසර තුල 1423 වශයෙන් දිනුම්වාර පවත්වා තිබූ අතර වැඩි වී තිබූ දිනුම්වාර සංඛ්‍යාව 07ක් වේ. | දිනුම්වාර සංඛ්‍යාව වැඩිකිරීම නිවැරදි අධ්‍යානයක් මත සිදු කිරීම. |